# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,700 — 1966 ජූනි 16 වැනි බ්‍රහස්පතින්ද — 1966.6.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවිකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 419 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. | 432 |
| සනතුරු-ඇබෑර්තු .. .. .. | 425 | අය-වැය ලේඛන .. | 433 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. | — | දේපළ විකිණීම .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. | 427 | මාර්ග කොමිටි දන්වීම .. .. | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම . | — | විවිධ දන්වීම .. .. .. | 434 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී—බී 39/52

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙලම්,
පළාත් පාලන ඇමතිවරයා.

1966 මැයි මස 27 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය, යාපනය දිස්ත්‍රික්කයේ කුඩතනේ ගම් ප්‍රදේශයේ ගම්සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු යයි ප්‍රකාශ කරමින්, 1952 නොවැම්බර් මස 14 වැනි දින අංක 10,469 දරන ගැසට් පත්‍රයේ පළ කරවන ලද ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

6-816—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 60/43 : ඇල්.ජී.ඩී.—ඒඩී. 2/231.

### ගෙවල් කුලී සීමා කිරීමේ පනත

(274 වැනි අධිකාරය වන) ගෙවල් කුලී සීමා කිරීමේ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම මේ නිවේදනයෙන්—

(අ) දනට මාවනැල්ල සුළු නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශය, ඉහතකී පනත ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරමි. තවද,

(ආ) මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දිනය මේ නිවේදනය වලංගු විය යුතු දිනය වශයෙන් නියම කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 මැයි මස 23 වැනි දින,
කොළඹදී.

6-803/1—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

ඇල්.—බී. 60/43 : ඇල්.ජී.ඩී.—ඒඩී. 2/231.

### ගෙවල් කුලී සීමාකිරීමේ පනත

(274 වැනි අධිකාරය වන) ගෙවල් කුලී සීමා කිරීමේ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම මේ නිවේදනයෙන්—

(අ) දනට අළුත්නුවර ගම් සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශය, ඉහත කී පනත ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරමි. තවද,

(ආ) මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දිනය මේ නිවේදනය වලංගු විය යුතු දිනය වශයෙන් නියම කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 මැයි මස 23 වැනි දින,
කොළඹ දී ය.

6-803/2—66.6.16 දින අංක 14,700 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩි.—බී 37/40

## මඩකලපුව ජල කර්මාන්ත ආඥපනත

(209 වැනි අධිකාරය වන) මඩකලපුව ජල කර්මාන්ත ආඥපනතේ 5 (1) වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදිත නිවේදනය.

ඊ. ජී. ගුණවර්ධන,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1966 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### නිවේදනය

මඩකලපුව ජල කර්මාන්ත ආඥපනතේ 4 වැනි වගන්තිය යටතේ 1966 වර්ෂය වෙනුවෙන් පනවන ලද ජල බද්දෙන් මීට යාකොට ඇති උපලේඛන යෙහි විස්තර කර ඇති ස්ථාන මෙයින් සම්පූර්ණයෙන් ම නිදහස් කරනු ලැබේ.

### උපලේඛනය

#### අංක 6 දරන ඡන්ද කොට්ඨාශය

බාර් පාර : අංක 26, 76, 76/1 සහ 80 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

පරණ නානායම් පාර : අංක 21, 23, 27, 27/1, 27/2, 27/3, 31, 35, 39, 30, 32, 34, 38, 38/3, 38/4, 38/6, 38/7, 38/9, 38/15, 40, 42, 46, 46/2, 46/3, 46/5 සහ 50 දරන ස්ථාන.

පයනියර් පාර : අංක 79, 81, 87, 87/1, 87/2, 91, 91/1 සහ 91/2 දරන ස්ථාන.

#### අංක 7 දරන ඡන්ද කොට්ඨාශය

බ්‍රෙලික්‍රෝස් පාර : අංක 12 සහ 16 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

බාර් පාර : අංක 88, 100, 102, 112, 120, 122, 128, 128/1, 128/2, 132, 136, 136/1, 140, 142, 172, 192, 210, 212, 214 සහ 220 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

අළුත් පාර : අංක 1, 3, 3/1, 3/2, 3/3, 3/4, 3/5, 20, 40, 60, 70, 74, 76, 78, 80, 86, 90, 92 පරණ අංක 1, 35, 35ඒ, 35/1, 37, 37/1, 37/2 සහ 37/2ඒ දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

ඩෝබි වීදිය : අංක 36, 36/1 සහ 50 දරන ස්ථාන.

ලේඩි මැනිං ඩ්‍රයිව් : අංක 135/3 දරන ස්ථානය.

#### අංක 8 දරන ඡන්ද කොට්ඨාශය

බාර් පාර : අංක 169, 171, 171/1, 189, 189/1, 189/2, 189/3, 189/4, 195, 195/1, 197, 201, 205, 209, 215, 217, 219, 221, 225 සහ 255 දරන ස්ථාන.

මායිම පාර : අංක 6 දරන ස්ථානය හැර අනිකුත් සියලුම ස්ථාන.

දුම්රියපොල පාර : අංක 11, 21, 10, 18, 18/1, 20, 20/2, 20/3, 20/4, 20/5 සහ 20/6 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

දුම්රියපොල හරස් පාර : අංක 1, 9, 11, 21 සහ 23 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

කමරෙයිකර්නි වීදිය : අංක 15, 15/10, 6, 6/1, 6/2, 6/3, 12, 16, 20, 20/2, 20/3, 20/4, 20/5, 20/7, 20/8 සහ 20/9 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

මායිම් පටු මාවත : සියලුම ස්ථාන.

තැබෑරුම පාර : සියලුම ස්ථාන.

කමරෙයිකර්නි 1 වැනි හරස් පාර : අංක 16/2, 16/4, 37 සහ 41 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

කමරෙයිකර්නි හරස් පාර : සියලුම ස්ථාන.

සිරිල් පටු මාවත : සියලුම ස්ථාන.

ත්‍රිකුණාමල පාර : අංක 202, 210, 214, 220, 220/1, 224, 224/1, 228, 228/2, 228/3, 232, 232/1, 238, 242, 248, 252 සහ 258 දරන ස්ථාන.

ජාතිමාගිරි පාර : සියලුම ස්ථාන.

භාරතී පටු මාවත : සියලුම ස්ථාන.

#### අංක 9 දරන ඡන්ද කොට්ඨාශය

බෙලි හරස් පාර : අංක 31/4, 41, 47, 47, 47/1, 55, 63, 63/1, 69, 73 සහ 77 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

බාර් පාර : සියලුම ස්ථාන.

පෙරිය උප්පොඩයි පාර : සියලුම ස්ථාන.

උප්පොඩයි කුඩා පටු මාවත : අංක 42/2 දරන ස්ථානය හැර අනිකුත් සියලුම ස්ථාන.

උප්පොඩයි මූනායි ප්‍රවේශ මග : අංක 1, 3 සහ 9 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

උප්පොඩයි පාර : අංක 9, 9/3, 9/5, 9/7, 15, 19, 29, 29/1, 29/6, 29/7, 29/13, 29/20, 39, 39/2, 45, 45/1, 8, 14, 14/1, 18, 24, 28, 34, 38, 44, 44/1 සහ 46 දරන ස්ථාන.

උප්පොඩයි වැව පාර අංක 1 : අංක 51/1, 139/1, 149, 155, 161, 169, 169/1, 175, 175/1 හා පරණ අංක 81/3, 81/4, 81/5 සහ 81/6 දරන ස්ථාන.

අංක 2 දරන උප්පොඩයි වැව පාර : සියලුම ස්ථාන.

සකාරියාස් පටු මාවත : සියලුම ස්ථාන.

පාක්‍යාම් පටු මාවත : සියලුම ස්ථාන.

#### අංක 10 දරන ඡන්ද කොට්ඨාශය

ත්‍රිකුණාමල පාර : අංක 5 සහ 339 දරන ස්ථාන අතර වැටී ඇති ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

ඌරනි පටු මාවත : සියලුම ස්ථාන.

ජ්‍යෙරොන්ස් පටු මාවත : සියලුම ස්ථාන.

මානි පටු මාවත : සියලුම ස්ථාන.

අළුත් මායිම පාර : සියලුම ස්ථාන.

සෙල්වනායගම් පාර : සියලුම ස්ථාන.

#### අංක 11 දරන ඡන්ද කොට්ඨාශය

මායිම පාර : සියලුම ස්ථාන.

අංක 1 දරන මායිම පාර පටු මාවතේ සිට අංක 8 දරන මායිම පාර පටු මාවත දක්වා සියලුම ස්ථාන.

භාරතී පටු මාවත : සියලුම ස්ථාන.

සුසාන භූමි පාරේ අංක 1 දරන පටු මාවත : සියලුම ස්ථාන.

සුසාන භූමි පාර : සියලුම ස්ථාන.

සිරිල් පටු මාවත : සියලුම ස්ථාන.

අංක 1 දරන කුලවඩි පටු මාවතේ සිට අංක 9 දරන කුලවඩි පටු මාවත දක්වා—සියලුම ස්ථාන.

කුමාර කෝවිල් පටු මාවත : සියලුම ස්ථාන.

කුලවඩි පටු මාවත : සියලුම ස්ථාන.

අංක 1 දරන කුමාර කෝවිල් පටු මාවත : සියලුම ස්ථාන.

මාමංග පිල්ලෙයාර් පටු මාවත : සියලුම ස්ථාන.

අංක 1 දරන මාමංග පිල්ලෙයාර් පටු මාවත : සියලුම ස්ථාන.

අළුත් මායිම පාර : සියලුම ස්ථාන.

රොසයිරෝ පටු මාවත : සියලුම ස්ථාන.

සෙල්වනායගම් පාර : සියලුම ස්ථාන.

ත්‍රිකුණාමළ පාර : සියලුම ස්ථාන.

ත්‍රිකුණාමළ පාරේ අංක 1 දරන පටු මාවත : සියලුම ස්ථාන.

ත්‍රිකුණාමල පාරේ අංක 2 දරන පටු මාවත : සියලුම ස්ථාන.

#### අංක 12 දරන ඡන්ද කොට්ඨාශය

බාර් පාර : අංක 391/1, 401, 401/1, 405, 409, 409/1, 411, 411/1, 413, 415, 417, 419, 423, 425, 427, 429, 429/1, 433, 433/1, 435, 437, 439, 441, 441/1, 443, 445, 445/1, 447, 447/1, 449, 451, 453, 455, 459, 461, 465, 465/1, 469, 469/1, 469/2, 473, 475, 475/1, 477, 481, 180 සහ පැරණි අංක 183 දරන ස්ථාන හැර අනිකුත් සියලුම ස්ථාන.

අමිර්තගලි සුසාන භූමිය පාර : සියලුම ස්ථාන.

අමිර්තගලි 3 වැනි හරස් වීදිය : සියලුම ස්ථාන.

කදිරාමර් පාර : සියලුම ස්ථාන.

කාලි කෝවිලි පටු මාවත—සියලුම ස්ථාන.

අංක 1 දරන කුලවඩි පටු මාවතේ සිට අංක 12 දරන කුලවඩි පටු මාවත දක්වා : සියලුම ස්ථාන.

මාමංග පිල්ලෙයාර් පටු මාවත : සියලුම ස්ථාන.

මාමංගම් පාර : සියලුම ස්ථාන.

මාරිඅම්මන් කෝවිල පටු මාවත : සියලුම ස්ථාන.

අළුත් මායිම් පාර : සියලුම ස්ථාන.

පුන්නකෝලයි පටු මාවත : සියලුම ස්ථාන.

පාසැල පටු මාවත : සියලුම ස්ථාන.

සිති විනායගර් පාර : සියලුම ස්ථාන.

6–814—66.6.16 දින අංක 14,700 දරන ගැසට් පත්‍රය

ඇල්. ඕ—බී 39/52

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙලම්,
පළාත් පාලන ඇමතිවරයා.

1966 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය, අම්පාරෙ දිස්ත්‍රික්කයේ උතුරුකරවනු ගම් ප්‍රදේශයේ ගම්සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුයයි ප්‍රකාශ කරමින්, 1954 ජූනි 25 වැනි දින අංක 10,685 දරන ගැසට් පත්‍රයේ පළකරවන ලද ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

6–815—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඕ—බී 15/65.

## දෙහිඕවිට සුළු නගර සභාව

### සුළු නගරසභා ආඥාපනත

### 1966 සඳහා වූ දේපළ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 159 (1) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, ඔහු විසින් දෙන ලද අනුමතිය ඇතිව, සභාව විසින් නියම කළ හැකි සීමා කිරීම්, විශේෂයන් හා කොන්දේසිවලට යටත්ව දෙහිඕවිට නගර සීමා තුළ පිහිටා තිබෙන (කුඹුරු හැර) සියලු ම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ වරිපනම් බද්දක් පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි අවසන්වන තුන් මාස කාල සීමා සඳහා සමාන කොටස් හතරකින් ඒ දිනයන්හි ගෙවිය හැකි පරිදි 1966 වර්ෂය සඳහා දෙහිඕවිට සුළු නගර සභාව විසින් පනවනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

6–812—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී. 21/65.

## දඹුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වගන්ති යටතේ දඹුල්ල සුළු නගර සභාව මඟින් සම්පාදනය කරනු ලැබ, ඒ ආඥාපනතේ 153 වන වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1966 මැයි මස 29 වැනි දින,
කොළඹ දීය.

(1) පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර ලෙස සැලකිය යුතුය :—

හාල් මෝලක් පවත්වාගෙන යෑම
කම්මලක් පවත්වාගෙන යෑම
වඩු මඩුවක් පවත්වාගෙන යෑම
උළු හෝ ගඩොල් ගබඩා කර තැබීම
ස්වර්ණාභරණ නිපදවීම
මෝටර් රථ අළුත්වැඩියා කරන හෝ සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම
අම්මලකර වායුවෙන් පැස්සීම් කරනු ලබන යම් ව්‍යාපාරයක්
බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යෑම
විකිණීම සඳහා පිදුරු ගබඩා කර තැබීම
ලී මඩුවක් පවත්වාගෙන යාම
සියයට වැඩි ප්‍රමාණයක් ගිනිගෝනි ගබඩා කිරීම
හිස් බෝතල් ගබඩා කර තැබීම
කබොක් ගල්, බොරළු හෝ කළුගල් සඳහා වළවල් කැපීම
බෙලෙක් වැඩපොළක් පවත්වාගෙන යාම
වළක් කැපීමෙන් හුණුගල් ලබාගැනීම
ගිනියම් කර පැස්සීමේ වැඩපොළක් පවත්වාගෙන යාම
වී හෝ වෙන යම් ධාන්‍ය ගබඩා කිරීම
පරණ හෝ අළුත් යකඩ බඩු ගබඩා කර තැබීම
මිරිස් ඇඹරුම් මෝලක් පවත්වාගෙන යාම
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
දර ගබඩා කිරීම
සිමෙන්ති ගබඩා කර තැබීම

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—

තොග ගණනේ විකිණීම පිණිස නරක්විය හැකි ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම
ජාඩි හෝ කරවල ගබඩා කර තැබීම
මාළු අයිස් දැමීම
බිඩි නිපදවීම

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—

උළු හෝ ගඩොල් පිළිස්සීම
බැටරි පිරවීම
හුණු ගල් පිළිස්සීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැලිවලට කැඩීම
භූමිතෙල් ගබඩා කිරීම
අයිස්ක්‍රීම් නිපදවීම
ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
යන්ත්‍රානුසාරයෙන් ගල් කැඩීම.

6–813—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

ඇල් ඕ.—බී 29/62.

## ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වෙනි වගන්තිය යටතේ නිසි බලධාරයා විසින්, එනම්, බදුල්ල දිස්ත්‍රික්කයේ ලුණුගල සුළු නගර සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර ඔහු විසින් ස්ථිර කරන ලද නියෝග.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1966 මැයි 16 වැනි දින,
කොළඹදී ය.

### නියෝග

1. කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) ඒ සභා ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරණු ලැබීමට සුදුසු යැයි අනුමතකර තිබේ නම් මිස, හෝ

(ආ) මේ නියෝගයේ (අ) ඡේදය යටතේ ඒ සභා අනුමත කරනු ලැබූ වේලාවෙන් පැය 24 කාලසීමාවක් ඉකුත්වීයාමෙන් පසුව යම් අවස්ථාවකදී, හෝ

(ඇ) යම් දිනෙක පූ. භා. 6 ටත්, පූ. භා. 11 ටත්, අතර මිස,

ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

එහෙත් විශේෂ යයි තමා අදහස් කරන කවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

2. 1 වැනි නියෝගය යටතේ අනුමත කලාට පසු ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙන් පනපිටින් ඉවත් කර ඇති යම් සතකු නැවතත් පරීක්‍ෂාකොට මිනිසුන් ගේ ආහාර පිනිස මරණු ලැබීමට සුදුසුයයි ඒ නියෝගය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස කිසිම තැනැත්තකු විසින් ඒ සතා ගෝ ඝාතක ස්ථානයකදී නොමැරිය යුතුය.

3. (1) යම් සතකු 1 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කලාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන් ගේ ආහාරය පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියොත් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

(2) මේ නියෝගය යටතේ මැරීම තහනම්කරනු ලැබූ යම් සතකු කිසිම තැනැත්තකු විසින් නොමැරිය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමිභාගයෙහි නවත්වා සිටින කාලය තුල ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම විධිවිධානයක් ම සැලැස්විය යුතුය.

5. ගෝ ඝාතක ස්ථානයට යම් සතකු ගෙනඑන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා මරණු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම්, එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ගෝ ඝාතක ස්ථානය පිහිටි භූමි භාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

6. (1) ගෝ ඝාතක ස්ථානයේදී මරන ලද යම් සතකුගේ මස් හෝ අතුනුබහන් ආදිය ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන් ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම්, ඔහු විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය වහාම විනාශකර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වළකින අන්දමින් ඉවත් කරවිය යුතුය.

(2) කිසිම තැනැත්තකු විසින් මිනිසුන් ගේ ආහාරයට නුසුදුසුයයි (1) ඡේදය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ නියමය යටතේ මිස ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

7. මිනිසුන් ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමතකර නැත්තාවූ හෝ 3 වැනි නියෝගයේ විධි විධාන පරිදි මැරීම තහනම්කර තිබෙන්නාවූ කිසිම සතකු මැරීමට ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින් අවසර නොදිය යුතුය.

8. මිනිසුන් ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපයේ ඉස් සරහා ගාත්වලත් පස්සා ගාත්වලත් ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින් " සු. නා. ස. ලු. " යන අකුරු හා අවස්ථා වෝචිත පරිදි " ඕස්ට්‍රේලියානු හරක් මස් ", " එළු මස් ", " බැටළු මස් " හෝ " ඌරු මස් " යන සලකුණුවලින් එකක් හෝ මුද්‍රානබා ඇතහොත් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ කුණ පය ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නො කළ යුතුය.

9. වෙනත් යම් සතකු ඉදිරියේ හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත්කර හෝ මුවාකර හෝ ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන තුරු කිසිම සතකු නොමැරිය යුතුය.

10. යම් බෝවන රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළෙමින් සිටි හෝ එබඳු රෝගයකින් පෙළෙමින් සිටි තැනැත්තකුට ළඟදී සාත්තුකිරීමෙහි යෙදී සිටි කිසිම තැනැත්තකුට එකී රෝගය බෝවන කාලසීමාව හා විෂබීජ මේරීමට ගතවන කාලසීමාව ඉකුත්වන තුරු යම් ගෝ ඝාතක ස්ථානයකට ඇතුල් වීමට හෝ සතුන් මැරීමේ කටයුතුවල යෙදීමට ඒ ගෝ ඝාතක ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් අවසර නොදිය යුතුය.

11. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් සුදුසු සියලුම අවස්ථාවලදී යම් ගෝ ඝාතක ස්ථානයකට ඇතුල්ව එකී ස්ථානය පරීක්‍ෂාකර බලනු ලැබීම නීත්‍යනුකූලවන අතර, එම ස්ථානය භාරකරු විසින් ඔහුට ඒ සඳහා අවශ්‍ය සියලුම සහාය දිය යුතුය.

12. (1) සභාව විසින් පිහිටුවා ඇති යම් ගෝ ඝාතක ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් සභාවට කලින් ගෙවිය යුතුය. ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් නිල කුවිතාන්සියක් නැතිව කිසිම සතකු නොමැරිය යුතුය.

| | | රු. ශ. |
|---|---|---|
| හරකුන් සඳහා එකකුට | ... | 2 00 |
| එළුවන් හෝ බැටළුවන් සඳහා එකකුට | ... | 1 00 |
| සූකරයන් සඳහා එකකුට | ... | 1 00 |

13. සෑම ගෝ ඝාතක ස්ථානයකම භාරකරු විසින් ගෝ ඝාතක ස්ථානයේ දී මරනු ලබන එක් එක් සතා පිළිබඳ විස්තර ලේඛනයක් සභාව විසින් නියමකළ හැකි ආකෘතිය අනුව තබාගත යුතුය.

14. මේ නියෝගවලින් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා වෙත පවරා ඇති බලතල, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ සාමාන්‍ය හෝ විශේෂ නියමයන් යටතේ ක්‍රියාකරන යම් නිලධරයකු විසින් ක්‍රියාවෙහි යෙදවිය හැකිය.

15. මේ නියෝගවල—

" සතා " යනුවෙන් යම් ගවයෙක්, එළුවෙක්, බැටළුවෙක් හෝ සූකරයෙක් අදහස් වේ;

" ගවයන් " යන්නට මී ගවයෝද ඇතුලත් වෙති;

" සභාපති " යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ;

" සභාව " යනුවෙන් ලුණුගල සුළු නගර සභාව අදහස් වේ.

6–810—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන (පාලන කොට්ඨාශ පිළිබඳ) ආඥපනත (256 වන පරිච්ඡේදය) යටතේ වූ නිවේදනය

බටහිර කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් බී. ලියනමාන මහතා නිවාඩු පිට සිය ධුරයෙන් බැහැරව සිටින කාලය තුළදී එකී ධුරයෙහි වැඩ බැලීම සඳහා 1966 මැයි මස 29 වැනි දින සිට ලියනමාන මහතා නැවත රාජකාරි බාරගන්නා තෙක් පළාත් පාලන සහකාර කොමසාරිස් සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා පත්කර ඇති බැව් මෙයින් දන්වනු ලැබේ.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
පළාත් පාලන කොමසාරිස්.

1966 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

6–546—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### ගම් සභා ආඥපනතේ 17 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර උතුරු (ඉහළ) කොටසේ පළාත් පාලන සහකාර කොමසාරිස් සිවසුබ්‍රමානියම් චින්මයා නන්දගුරු මානික්කවාසගර් වන මා විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම්කාර්‍ය්‍ය සභාවට සභාපති කෙනෙකු පත්කර ගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයේ දී, 3 වැනි තීරුවේ සඳහන් වේලාවේදී, 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයේදීද, රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඇස්. සී. මානික්කවාසගර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
උතුරු කොටස (ඉහල), යාපනය.

1966 ක් වූ ජූනි මස 7 වැනිද,
යාපනයේ උතුරු (ඉහළ) පළාත් පාලන කාර්‍ය්‍යාලයේදී ය.

### උපලේඛනය

| 1 වැනි තීරුව | 2 වැනි තීරුව | 3 වැනි තීරුව | 4 වැනි තීරුව |
|---|---|---|---|
| ගම්කාර්‍ය්‍ය සභාවේ නම | දිනය | වේලාව | ස්ථානය |
| චුලිපුරම් ... | 23.6.66 ... | පූ.භා. 9.30... | ගම්කාර්‍ය්‍ය සභා කාර්‍ය්‍යාලය |
| සුලෝලි ... | එම ... | පූ.භා. 11.30... | එම |
| මුහමාලෙයි ... | එම ... | අ.භා. 3.30... | එම |

6—740—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය වන) 17 (1) වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, බටහිර දිසාවේ වැඩ බලන සහකාර පළාත් පාලන කොමසාරිස් සී. ඩබ්ලිව්. ද සිල්වා වන මා විසින්, මීට යා කොට ඇති උපලේඛනයේ I වැනි තීරුවෙන් නියමිත, එක් එක් ගම්සභාවේ ප්‍රථම රැස්වීම, එකී උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත දිනයේදී ද, එකී උප ලේඛනයේ III වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත වේලාවට ද, එකී උපලේඛනයේ IV වැනි තීරුවෙන් නියමිත ස්ථානයේ දී ද මෙයින් කැඳවා සිටිනු ලැබේ.

සී. ඩබ්ලිව්. ද සිල්වා,
බටහිර දිසාවේ වැඩබලන සහකාර පළාත් පාලන
කොමසාරිස්.

1966 ජූනි මස 8 වැනි දින,
කොළඹ 4, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව | IV වැනි තීරුව |
|---|---|---|---|
| ගම්සභාවේ නම | දිනය | වේලාව | ස්ථානය |
| බියගම ගම්සභාව ... | 1966.6.24 ... | පූ.භා. 9.00 ... | කලින් කැළණිය ගම්සභා කාර්යාලය පිහිටුවා තිබුන ගොඩනැගිල්ල |
| නාරන්වල ගම්සභාව | 1966.6.24 ... | පූ.භා. 11.00... | නාරන්වල ගම්සභා කාර්යාලය |

6–811—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ඕ.—බී. 109/45.

## සුසාන භූමි සහ භූමදාන ආඥාපනත

බදුල්ල පොදු සුසාන භූමිය සම්බන්ධයෙන් (231 වැනි අධිකාරය වන) සුසාන භූමි සහ භූමිදාන ආඥාපනතේ 17 සහ 22 වැනි වගන්ති යටතේ, ඒ පිළිබඳ නියම බලධරයා වූ බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබූ නියෝගයයි.

මිල්රෝයි රත්වත්ත,
බදුල්ල මහා නගර සභාවේ නගරාධිපති.

1966 මැයි මස 29 වැනි දින,
බදුල්ල.

### නියෝගය

1948 නොවැම්බර් 26 වැනි දින අංක 9,922 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබුවාවූද, 1958 නොවැම්බර් 28 වැනි දින අංක 11,603 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධනය කරනු ලැබුවාවූද, බදුල්ල පොදු සුසාන භූමිය පිළිබඳ නියෝග පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) 10 වැනි නියෝගය වෙනුවට පහත සඳහන් අලුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"10. කිසිම ආදාහනයක් හෝ අනතුරුව සොහොන් කොතක් තුළ හෝ සොහොන් ගෙයක් තුළ කරනු ලබන භූමදානයක් සඳහා හෝ භෂ්මාවශේෂ සහිත බඳුනක් භූමදානය කිරීම සඳහා විධි විධාන සලස්වන තැනැත්තා විසින් මීට යා කොට ඇති උපලේඛනයෙහි සඳහන් ප්‍රමාණ අනුව ගාස්තුවක් සුසාන භූමි පාලකයා වෙත ගෙවිය යුතුය."

(2) එහි උපලේඛනය වෙනුවට පහත සඳහන් අලුත් උපලේඛනය ආදේශ කිරීමෙන් :—

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. සොහොන් කොතක් තුළ හෝ සොහොන් ගෙයක් තුළ අනතුරුව කරනු ලබන එක් එක් භූමදානය සඳහා ... ... ... | 5 00 |
| 2. එක් එක් ආදාහනය සඳහා ... ... | 5 00 |
| 3. භෂ්මාවශේෂ සහිත බඳුනක් හෝ වෙනයම් භාජනයක් භූමදානය කිරීම සඳහා ... ... | 2 00 |

6–804—66.6. 16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර, (ඉහළ) මධ්‍යම දිශාවේ සහකාර පළාත් පාලන කොමසාරිස් බී. අලුවිහාරේ වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මැදසිය පත්තුව ගම්සභාවෙහි අංක 1 දරණ කොට්ඨාශයෙහි සභික ඩබ්ලිව්. ඇම්. උක්කුබන්ඩා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිලිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට, තමන් තෝරාපත් කර ගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සැඟිමට පත්ව, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මැදසිය පත්තුව ගම්සභාවෙහි අංක 1 දරණ කොට්ඨාශයෙහි සභික ඩබ්ලිව්. ඇම්. උක්කු බන්ඩා මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට තම සාමාජිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

බී. අලුවිහාරේ,
සහකාර පළාත් පාලන කොමසාරිස් තැන,
(ඉහළ) මධ්‍යම දිශාව.

1966 මැයි මස 31 දින,
මාතලේ දී ය.

6–809—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

### 17 වන වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර පහළ දකුණු දිශාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් හෙට්ටිආරච්චිගේ පියදාස අභයවර්ධන වන මා විසින් මීට යාකොට ඇති උපලේඛනයේ පළවැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත ගම්සභාවල ප්‍රථම රැස්වීම් එහි ඇති උපලේඛනයේ දෙවැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත දිනයේ දී ද එකී උපලේඛනයේ තුන් වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත වේලාවලට ද එකී උපලේඛනයේ හතර වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත ස්ථානයේ දී ද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

එච්. ඒ. පී. අභයවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස් තැන,
පහළ දකුණු දිශාව—මාතර.

1966 ජූනි මස 9 වැනි දින,
මාතර පළාත් පාලන කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| I වැනි තීරුව ගම්සභාවේ නම | II වැනි තීරුව දිනය | III වැනි තීරුව වේලාව | IV වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| කඹුරුපිටිය ... | 23.6.66 ... | ප.ව. 1.30... | කඹුරුපිටිය ගම් සභා කාර්යාලය |
| කිරින්ද-පුහුල්වැල්ල ... | 23.6.66 ... | ප.ව. 3.00... | මාර/පුහුල්වැල්ල මහා විද්‍යාලය |

6–808—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පණතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර ඌවේ පළාත් පාලන සහකාර කොමසාරිස්, මුතු බණ්ඩා සමරකෝන් වන මම, මොණරාගල දිස්ත්‍රික්කයේ කොටගම ගම්සභාවේ සභාපති තෝරීම සඳහා එම ගම්සභාවේ රැස්වීමක්, 1966 ජූනි මස 23 වැනි දින පෙරවරු 10 ට යල්කුඹුරේ පිහිටි කොටගම ගම්සභා කාර්යාලයේදී කැඳවන බැව් මෙයින් නිවේදනය කරමි.

එම්. බී. සමරකෝන්,
ඌවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966. 6. 4 දින,
බදුල්ල.

6–673—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය වන) 17(1) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, දකුණු කොටස (ඉහල) පළාත් පාලන සහකාර කොමසාරිස්, වික්‍රමරත්න කොඩිප්පිල ආරච්චි පටබැඳිගේ ජර්සි අබේසිංහ වන මා විසින් ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම්සභාවට සභාපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා රැස්වීමක් 1966 ජූනි මස 22 වැනි දින උදේ 10.30 ට අහුන්ගල්ලේ පිහිටි කොස්ගොඩ ගම්සභා කාර්යාලයේදී මෙයින් කැඳවා සිටිනු ලැබේ.

වික්‍රමරත්න කොඩිප්පිල ආරච්චි පටබැඳිගේ ජර්සි අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
දකුණු කොටස (ඉහල).

1966.6.11 වැනි දින,
ගාල්ලේ පළාත් පාලන කාර්යාලයේදීය.

6–871—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### ගම්සභා ආඥාපනතේ 17 (1) වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර වයඹ කොටසේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාරියවසම් පතිරගේ ඇඩ්වින් පියතිලක වන මා විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම් සභාවේ සභාපති පත්කරගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයේදී 3 වැනි තීරුවේ සඳහන් වේලාවේදී 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයේදී, රැස්වීම මෙයින් කැඳවා සිටිනු ලැබේ.

කේ. පී. ඊ. පියතිලක,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
වයඹ කොටස.

1966 ජූනි මස 12 වැනි දින,
කුරුණෑගල, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

### උපලේඛනය

| 1 වැනි තීරුව ගම්සභාවේ නම | 2 වැනි තීරුව දිනය | 3 වැනි තීරුව වේලාව | 4 වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| කුඹුක්වැව ... | 1966.6.24 | පෙ.ව. 10.30ට | කුඹුක්ගැටේ රජයේ විද්‍යාලය. |

6–940—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### ගම්සභා ආඥාපනතේ 17 (1) වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම් සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (1) දරන වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, වයඹ කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, කාරියවසම් පතිරගේ එඩ්වින් පියතිලක වන මා විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම් සභාවේ සභාපති පත්කර ගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයෙහි දී 3 වැනි තීරුවේ සඳහන් වේලාවෙහි දී 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයෙහි දී ප්‍රථම රැස්වීම මෙයින් කැඳවා සිටිනු ලැබේ.

කේ. පී. ඊ. පියතිලක,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
වයඹ කොට්ඨාශය.

1966 ජූනි මස 12 වැනි දින,
කුරුණෑගල, පළාත් පාලන කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| 1 වැනි තීරුව ගම්සභාවේ නම | 2 වැනි තීරුව දිනය | 3 වැනි තීරුව වේලාව | 4 වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| යටකලන් පත්තු | 1966.6.29 | ප.ව. 3.30 ට | යටකලන්පත්තු ගම්සභා කාර්යාලයේ දී. |

6–941—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින් ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් ව සිටිය යුතුයි.

4. නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාල පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන් ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්වත්" නියම් කරනු ලැබෙති.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙති.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමා වෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න.)

(ඇ) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගය කින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමර්ථ්‍යයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ඈ) කාර්යක්ෂමතා කඩයිම්.—පත්වීම් ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකික යකු බවට සැහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරු වනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන දැන්වීම් සඳහා වයස් සීමාවක් නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන් ම සුදුසුවෙති.

**8. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය පාලනමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් නිදහස්කට හැකි බවත් කිසිත් යා ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පසු කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා නම් සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

———————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදැහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයක් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්. ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) විට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සවිස්තර (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

අංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත් නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් සොයා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්. ඕ.—බී 20/65

### මුල්ලේරියාව සුළු නගර සභාව

#### සුළු නගර සභා ආඥාපනත

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වෙනි සහ 156 වෙනි වගන්ති යටතේ මුල්ලේරියාව සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථා 1965 (මුල්ලේරියාව සුළු නගර සභා) ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින් විය හැකිය.

2. කිසියම් වීදියක, පාරක, ඇලක හෝ වැවක සිට පෙනෙන පරිදි යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම, ඒ සම්බන්ධයෙන් සභාපති විසින් නිකුත් කළ අවසර පත්‍රයක බලය යටතේ මිස, කිසිම තැනැත්තකු විසින් නො කළ යුතුය.

එසේ වුවද, මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහතකී විධි විධාන පහත සඳහන් දැන්වීම් වලින් යම් කිසිවක් සම්බන්ධයෙන්, ඒ ප්‍රචාරක දැන්වීම ආලෝකමත් කොට ඇතහොත් හෝ ඉහළින් සවි කරන සංඥා දැන්වීමක් වෙතොත් මිස, අදාළ නො විය යුතුය :—

(අ) එකතුවන ශුබ ලාභ පුණ්‍යාධාර කටයුතු සඳහා යෙදවීම පිණිස පවත්වන විනෝද කටයුත්තකට අදාළ කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක්,

(ආ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කොට තබා ඇති ස්ථානයේ පවත්වනු ලබන විනෝද කටයුත්තකට අදාළ යම් දැන්වීමක්,

(ඇ) රජය මගින් ප්‍රදර්ශන කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක්,

(ඈ) ආගමික, දේශපාලන හෝ ප්‍රසිද්ධ රැස්වීමකට අදාළව කෙරෙන ප්‍රචාරක දැන්වීමක්,

(ඉ) යම් ගොඩනැගිල්ලක ජනේලයක වූ ප්‍රචාරක දැන්වීමක්,

(ඊ) "බදු දීමට තිබේ" යන ප්‍රචාරක දැන්වීමක්,

(උ) "විකිණීමට තිබේ" යන ප්‍රචාරක දැන්වීමක්,

(ඌ) ගෘහ නාම තහඩුවක්,

(එ) ප්‍රමාණයෙන් වර්ග අඩි එකකට වැඩි නොවන, වෘත්තීය කාර්ය සඳහා පාවිච්චි කෙරෙන නාම තහඩුවක්,

(ඒ) වෙළඳාම් කටයුතු සඳහා පාවිච්චි කරන වාහනයක, ඒ වාහනය අයිතිකරුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක්, හෝ

(ඔ) ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කෙරෙන ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන වෙළඳාමකට හෝ ව්‍යාපාර කටයුත්තකට අදාල යම් ප්‍රචාරක දැන්වීමක්.

3. (1) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා කෙරෙන සෑම ඉල්ලීමක්ම, ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයේ සිට යටත් පිරිසෙයින් දින හතකටවත් ප්‍රථම සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේ වුවද, විශේෂ අවස්ථාවලදී මේ ඡේදයේ ඉහත සඳහන් විධිවිධානවල නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කරනු නො ලබන ඉල්ලුම් පත්‍රයක් සභාපති විසින් බාරගත හැකිය.

(2) (1) වෙනි ඡේදයේ සඳහන් සෑම ඉල්ලීමක් සමග ඉල්ලුම් කරු විසින් ප්‍රචාරය කිරීමට බලාපොරොත්තුවන ප්‍රචාරක දැන්වීමේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

(3) (1) වන ඡේදයේ සඳහන් ඉල්ලීමක් සභාපති විසින් අනුමත කරන විටකදී ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයට, මෙහි ඇති උපලේඛනයේ සඳහන් ගණන් අනුව පිළියෙල කරන ලද ගාස්තුවක් ගෙවීමට සභාපති විසින් ඉල්ලුම්කරුට නියම කළ යුතුය. ඒ ගාස්තුව ගෙවන තෙක් ඒ අවසර පත්‍රය ඉල්ලුම් කරුට නිකුත් නො කළ යුතුය.

4. (1) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් යම් තැනැත්තකුට නිකුත් කළ අවස්ථාවක—

(අ) ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකම, ඒ අවසර පත්‍රයේ අංකය සහ දිනය සඳහන් කිරීමට, හෝ

(ආ) ඒ අවසර පත්‍රය සඳහා ගාස්තුවක් ගෙවූ බවට සළකුණක් වශයෙන් මුද්‍රා තැබීමේ කාර්ය්‍ය සඳහා ඒ ප්‍රචාරක දැන්වීමේ හැම පිටපතක්ම සභාපති වෙත ඉදිරිපත් කරවීමට,

සභාපති විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදය යටතේ සභාපති විසින් යම් තැනැත්තකුට විධානයක් කළේද, ඒ තැනැත්තා විසින් ඒ විධානය ඉෂ්ඨ කළ යුතුය.

5. (1) කිසිම තැනැත්තකු විසින්—

සභාපති විසින් අනුමත කරන ලද ආකාරයට තනන ලද හා ගොඩ නගන ලද නෙරා යන ප්‍රචාරක දැන්වීමක් වෙතොත් මිස, ගොඩනැගිලි සීමාවේ සිට තිරස් අතට කෙළින් මැනීමෙන් පසුව, පාරක් හෝ වීථියක් උඩින් අඟල් 6 කට වඩා දුර නෙරායන සේ යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම,

(2) පොළොවේ සිට අඩි විසිපහකට වඩා උස් වූ හෝ යම්කිසි වීථියක් හෝ පාරක් උඩින් නෙරා යන යම් දැන්වීම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම,

(3) යම් වීථියකට හෝ පාරකට යාබද ගොඩනැගිල්ලක මුහුණතට, ඒ මුහුණතේ සීමාවලින් පිටතට නෙරා සිටිනසේ දික්වූ නැතහොත් උසින් පදික වේදිකාවේ හෝ පොළවෙහි මධ්‍ය සමතාවයේ සිට සංඥවේ යට මට්ටම දක්වා ඇති දුර ප්‍රමාණයෙන් හතරෙන් එකකට වඩා කිසිම තැනක් වැඩිවූ යම් වෙළඳ සැල් සංඥවක් සවි කරවීම හෝ එල්ලා තැබවීම,

(4) සභාපති විසින් අනුමත නො කළ ආකාරයට ඉහලින් සවි කරන දැන්වීම් සංඥවක් සැදවීම හෝ ඉදි කරවීම,

නො කළ යුතු ය.

6. කිසිම තැනැත්තෙකු විසින් යම් ප්‍රසිද්ධ වන්දනීය ස්ථානයක, ප්‍රසිද්ධ උද්‍යානයක හෝ වැසිකිළියක හෝ යම් පාලමක, වීථියක, ලාම්පු කණුවක, විදුලි රථ මාර්ගයේ කණුවක හෝ විදුලි සංඥ හෝ විදුලි පණිවුඩ කණුවක කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම නො කළ යුතුය.

7. කිසිම තැනැත්තකු විසින්, යම් පාරක හෝ වීථියක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්ය්‍ය සඳහා කිසිම ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැමපෝනයක්, තූර්ය්‍යවාදන භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනයම් භාණ්ඩයක් පාවිච්චි නො කළ යුතුය.

8. (1) යම් ප්‍රචාරක දැන්වීමක් සභාපතිගේ අදහස අනුව අශෝභන හෝ නොනිසි තත්වයක තිබේ නම් ඔහු විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය තුළ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කරන ලෙස එය ප්‍රදර්ශනය කරවන තැනැත්තාට නියම කළ හැකිය.

(2) සභාපති විසින් (1) වෙනි ඡේදය යටතේ දැන්වීමක් බාර දෙනු ලැබූ තැනැත්තකු විසින් දැන්වීමේ නියමිත කාලය ඇතුළත දී ඒ දැන්වීම අනුව ක්‍රියාකළ යුතුය.

9. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් දැන්වීම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්—

(අ) එම දැන්වීම් පුවරුව නිසි පරිදි අළුත්වැඩියා කර සුරක්ෂිත තත්වයක පවත්වාගෙන යා යුතු අතර,

(ආ) තමාගේ නම සහ ලිපිනය පහසුවෙන් කියවිය හැකි පැහැදිලි අකුරෙන් ඒ දැන්වීම් පුවරුවේ ඉදිරිපසින් ප්‍රකට ස්ථානයක පෙන්නුම් කළ යුතුය.

10. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ අවසර පත්‍රය සඳහා මුදල් ගෙවූ බවට සළකුණක් වශයෙන් සභාපති විසින් එම දැන්වීමේ තබන ලද යම් සංඥවක්, සළකුණක්, අකුරක්, වචනයක් හෝ ඉලක්කමක් මැකීම හෝ මැකවීම කිසිම තැනැත්තකු විසින් නො කළ යුතුය.

11. කිසිම තැනැත්තකු විසින්—

(අ) සභාපති විසින් අනුමත කරන ලද ආකාරයට හෝ ස්වරූපයකට වෙනස් අයුරින් යම් ප්‍රචාරක දැන්වීමක් වාහනයක ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම, හෝ

(ආ) පොලිස් අධිකාරි විසින් අනුමත කළ ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් හැර වෙනයම් ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් ඇතිව යම් වාහනයක් යම් වීථියක හෝ පාරක පදවාගෙන යෑමට සැලැස්වීම

නොකළ යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලින් යමක් කඩ කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරුවීමේදී රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු අතර, ඒ කඩකිරීම දිගටම සිදු කරන අවස්ථාවකදී එසේ වරද කරු කිරීමෙන් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට සභාපති විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව ඒ වරද සිදු කරන සෑම දිනයක් සම්බන්ධයෙන්ම රුපියල් පහලොවකට නොවැඩි තවත් දඩයකට ද යටත් විය යුතුය.

13. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය නො වුවහොත්, මෙම අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රචාරක දැන්වීම්" යන්නට ප්‍රචාරක දැන්වීමක සවභාවයේ වූ හෝ ප්‍රචාරක කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පාවිච්චි කරනු ලබන්නාවූ ද, යම් ඉඩමක, ගොඩනැගිල්ලක, හෝ ඉදි කිරීමක දැක්වෙන්නා වූ ද, නැතහොත් එහි රඳවා ඇත්තා වූ ද යම් වචනයක්, අකුරක්, අංකයක්, සංඥවක්, දැන්වීම් කොළයක්, බෝඩ් එකක්, දැන්වීමක්, උපක්‍රමයක්, ආදර්ශයක් හෝ නිරූපණයක් ඇතුළත් වේ.

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යන්නෙන් මුල්ලේරියාව සුළු නගර සභාව අදහස් වේ.

"දැන්වීම් පුවරුව" යන්නෙන් යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්ය්‍ය සඳහා ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් ඉදි කිරීමක්, උපස්ථම්භකයක්, කණුවක්, බෝඩ් ලෑල්ලක්, තාප්පයක්, පෙට්ටියක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වේ.

"ඉහලින් සවිකරන දැන්වීම් සංඥව" යන්නෙන් යම් වීථියක, මාර්ගයක, ඇලක හෝ වවක යම් තැනක සිට බැලූ විට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් අහස පසුබිම් කොට පෙනෙන පරිදි යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදිකිරීමක හෝ එබන්දකට උඩින් දැක්වෙන යම් කණුවකට, රිටකට, ද්වජයකට, රාමුවකට හෝ වෙනත් උපස්ථම්භකයකට සවි කරන ලද ප්‍රචාරය කිරීමේ කාර්ය සඳහා වූ යම් වචනයක්, අකුරක්, ආදර්ශයක්, සංඥවක්, උපක්‍රමයක් හෝ නිරූපනයක් අදහස් වන අතර ප්‍රචාරය කිරීම සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ යම් ඉඩමක, ගොඩනැගිල්ලක, ඉදිකිරීමක, වීථියක හෝ මාර්ගයක හෝ එබන්දකට උඩින් පාවිච්චි කරනු ලබන යම් බැලූනයක්, පැරෂුටයක්, එරෝප්ලේන් එකක් හෝ වෙනත් එබඳු උපක්‍රමයක් එයට ඇතුළත් වේ.

## උපලේඛනය

**අවසර පත්‍ර සඳහා අය කරනු ලබන ගාස්තු ප්‍රමාණ**

අවසර පත්‍රය සඳහා වූ කාල සීමාව—

| | රු. ශ. |
|---|---|
| (අ) සති දෙකකට නොවැඩි වූ විට වර්ග අඩියකට ... | 25 |
| (ආ) සති දෙකකට වැඩි, නමුත් මසකට නොවැඩි වූ විට වර්ග අඩියකට ... ... | 50 |
| (ඇ) මසකට වැඩි, නමුත් වර්ෂයකට නොවැඩි වූ විට වර්ග අඩියකට ... ... | 1 0 |
| (ඈ) වර්ෂයකට වැඩි වූ විට, එක් එක් වර්ෂය හෝ ඉන් කොටසක් සඳහා වර්ග අඩියකට ... ... | 1 0 |

6-805—66.6.13 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

ඇ.ල්. ඕ—බී 17/65

## සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වන හා 156 වන වගන්ති යටතේ වරකාපොල සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඒ ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති වරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 මැයි මස 29 දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථාව

### මලාපවහන ගාස්තුව

1. සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XIX කොටසේ 6 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා සභාවට මාස්පතා ගෙවිය යුතු මලාපවහන ගාස්තුව, ශුද්ධ කරනු ලැබූ එක් එක් බාල්දිය සඳහා රුපියල් එකක් බැගින් විය යුතුය.

2. 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තු ඒ ගාස්තුව ලැබිය යුතු මාසයට පසු මාසයේ පස් වන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

6–807—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී 13/58
ප.පා.දෙ—ජී.ඒ 19/74

## ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ වවුනියාව දිස්ත්‍රික්කයේ බටහිර චින්නවෙඩ්ඩිකුලම් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

**ඊ. ජී. ගුණවර්ධන,**
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1966 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

### නිලධාරීන්

1. සභාවට අයවිය යුතු සියලුම අයබදු හෝ ගාස්තු එකතු කොට ස්වකීය අත්සනේ නිවැරදි පිටපත හා සභාවේ මුද්‍රාව ද අඩංගු මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස සභාපති විසින් ඕනෑම නිලධාරියෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

2. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) ගම් සභා ආඥාපනතේ විධිවිධාන හෝ එය යටතේ සම්පාදිත අතුරු ව්‍යවස්ථා මගින් හෝ ඒවා යටතේ සභාපතිට හෝ අන් කිසි නිලධාරියෙකුට පවරා තිබෙන යම් බලයක් පාවිච්චි කිරීමේ දී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉටු කිරීමේ දී හෝ නියම කර ඇති යම් කාර්යයක් ඉටු කිරීමේ දී සභාපතිට හෝ ඒ නිලධාරියාට ; හෝ

(ආ) සභාව විසින් හෝ සභාව වෙනුවෙන් සේවයෙහි යොදනු ලබන යම් සේවකයෙකු හෝ කම්කරුවෙකු සභාපති විසින් හෝ සභාවේ අන් කිසි නිලධාරියෙකු විසින් නීත්‍යනුකූලව පවරා තිබෙන යම් යුතුකමක් ඉටු කිරීමේදී ඒ සේවකයාට හෝ කම්කරුවාට ඕනෑකමින් බාධා නොකළ යුතුය.

**කිරිපට්ටි හා කිරි විකිණීම**

3. (1) කිරි පට්ටියක් පැවැත්වීම පිණිස සභාපති විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන තැනැත්තකු වුවහොත් මිස වෙනයම් තැනැත්තෙකු විසින් එළදෙනුන් දෙදෙනෙකුගෙන් හෝ ඊට වැඩි ගණනකින් යුත් කිරි පට්ටියක් නොපැවැත්විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ නිකුත් කරනු ලබන එක් එක් බලපත්‍රය සඳහා වූ ගාස්තුව, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ගාස්තු ප්‍රමාණ අනුව ගණන් බැලිය යුතුය.

4. එක් එළදෙනෙකුගෙන් ලබා ගන්නා කිරි විකිණීමට හෝ විකිණීම පිණිස තැබීමට අදහස් කරන හැම තැනැත්තෙකු විසින් ම ලියාපදිංචි කළ කිරි සපයන්නෙකු වශයෙන් සභාවේ පොත්වල ලියාපදිංචි කරවා ගැනීම පිණිස කටයුතු කර ඒ සඳහා වූ අවසර පත්‍රයක් සභාපති වෙතින් ලබා ගත යුතුය.

5. වතුර, හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ දියරක් එකතු කරන ලද කිරි, ගම් ප්‍රදේශය තුළ විකිණීම තැනින් තැන ගෙන ගොස් විකිණීම, විකිණීම් වශයෙන් බාරදීම හෝ විකිණීමට තැබීම හෝ විකිණීමට ගෙනයාම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

6. තමා කිරි පට්ටියක බලපත්‍රධාරියෙකු හෝ ලියාපදිංචි කළ කිරි සපයන්නෙකු හෝ එවැනි බලපත්‍රධාරියෙකුගේ හෝ ලියා පදිංචි කළ සපයන්නෙකුගේ බලයලත් නියෝජිතයකු වෙනොත් මිස ගම් ප්‍රදේශය ඇතුළත කිසිම අවස්ථාවක දී මොනම කිරි වර්ගයක් හෝ විකිණීම, විකිණීමට තැබීම හෝ විකිණීමට තබා ගැනීම හෝ විකිණීමට ගෙනයාම හෝ විකිණීමට තැනින් තැන ගෙන යාම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

7. කිරි විකිණීම පිණිස ගෙන යාමේදී, විකිණීම් වශයෙන් බාර දීමේ දී, ඇවිද විකිණීමේ දී හෝ විකිණීම පිණිස තබා තිබෙන විට හැම බලපත්‍රධාරියෙකුම ලියාපදිංචි කළ කිරි සැපයුම් කරුවකු හා කිරි වෙළෙන්දෙකුම, ඒ ඒ කාරණයේ හැටියට, ස්වකීය බලපත්‍රය, අවසර පත්‍රය හෝ ලියාදුන් අවසරය රැගෙන යා යුතු අතර, කිසියම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ සභාපති විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද වෙනත් තැනැත්තෙකු විසින් ඉල්ලා සිටි විට ඒ බලපත්‍රය අවසර පත්‍රය හෝ ලියාදුන් අවසරය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

8. කිරිපට්ටියක බලපත්‍රධාරියා විසින් සියලු ගොම, කුණු කසළ, මූත්‍ර, කුණුවතුර අඩුම ගණනේ දවසකට වරක් වත් කිරිපට්ටියෙන් ඉවත් කොට, ඒවායින් පීඩාවක් නොවන පරිදි සුදුස්සක් කළ යුතුය.

9. කිරි පට්ටියක බලපත්‍රධාරියා විසින් කිරි පට්ටියේ හැම කොටසක්ම සහ එහි අවට ප්‍රදේශය පිරිසිදුවත් සනීපාරක්ෂක තත්ත්වයෙනුත් තබා ගත යුතුය.

10. කිරිපට්ටියක බලපත්‍රධාරියා විසින් වීදුරු භාජන හෝ පිඟන් මැටි භාජන හෝ ඔප දැමූ මැටි භාජන හෝ බෙලෙක් හෝ එනැමල් කළ හෝ ගැල්වනයිස් කළ යකඩ භාජන හැර වෙනත් භාජනවල කිරි අසුරා තැබීමට සැලැස්වීම හෝ ඊට ඉඩ දීම හෝ නොකළ යුතුය.

11. යම් බෝවෙන රෝගයකින්, හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්මා බාධයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි, හෝ එබඳු රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කිසිම තැනැත්තෙකු එම රෝගය බෝවීමට හා රෝග බීජ මේරීමට ගතවන කාලය ඉකුත්වන තුරු කිරි පට්ටියට ඇතුලුවීම හෝ කිරි පිළියෙල කිරීමෙහි හෝ වෙළඳාමෙහි හෝ ප්‍රවාහනය කිරීමෙහි හෝ නිරත නොවිය යුතුය.

12. කිරි පට්ටියක බලපත්‍රධාරියා හෝ ලියාපදිංචි කිරි සපයන්නෙකු විසින් හෝ මනුෂ්‍ය පරිභෝගය සඳහා කිරි ලබා ගැනීම පිණිස දඬුවතේ යන එළදෙනුන්ගෙන් හෝ කිසියම් රෝගයකින් පෙලන එළදෙනුන්ගෙන් හෝ කිරි නොදෙවිය යුතුය.

13. 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද ඕනෑම බලපත්‍රයක් හෝ 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කර ඇති අවසර පත්‍රයක් හෝ ඕනෑම වර්ගයක ගව රෝග පවතින කිසියම් ප්‍රදේශයක අවශ්‍ය විය හැකි යම් කාල සීමාවක් තුළ දී සභාපති විසින් තාවකාලික වශයෙන් තහනම් කිරීම නීත්‍යනුකූල විය යුතුය.

14. ඕනෑම ස්ථානයකදී හෝ ඕනෑම වේලාවකදී ඕනෑම කිරි පට්ටියක කිරි හෝ විකිණීම පිණිස තබා ඇති හෝ විකිණීමට ගෙන යන කිරි පරීක්ෂා කිරීම සභාපති විසින්, හෝ සනීපාරක්ෂක පරීක්ෂක විසින් හෝ සභාපති විසින් ඒ සඳහා ලියවිල්ලකින් යථා පරිදි අවසර දෙන ලද වෙනත් යම් තැනැත්තෙකු විසින් හෝ ගම් ප්‍රදේශය තුළ කළ හැකිය.

15. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කර ඇති හැම බලපත්‍රයක්ම හෝ අවසර පත්‍රයක් ම එවැනි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කර ඇති වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වැනිදායින් අවසන් විය යුතුය.

**ගෙම්දූල්**

16. ගම් ප්‍රදේශය තුළ පිහිටි ඕනෑම නිවසක පදිංචිකරු විසින් හෝ පදිංචිකරුවකු නොමැති නම්, එහි අයිතිකරු විසින් එම ගෙම්දූල් ඉඩම ශුද්ධ පවිත්‍රවද, සනීපාරක්ෂක තත්වයෙන්ද වල් පැලෑටි වලින් හා කුණුකසළ වලින් තොරවද තබා ගත යුතුය.

### ගෙවල් ශුද්ධ පවිත්‍ර කිරීම

17. කිසියම් නිවසක් එහි පදිංචි කරුවන්ගේ හෝ අසල්වාසීන්ගේ හෝ සෞඛ්‍යයට හානිවන පරිද්දෙන් සනීපාරක්ෂක නොවන තත්ත්වයකින් හෝ බොහෝ අබලන් තත්වයකින් හෝ තිබේ යැයි පෙනී යන ඕනෑම අවස්ථාවකදී, දැන්වීමේ සඳහන් කාල සීමාව තුළ දී ඔහු විසින් කවර කටයුතු කළ යුතුද යන බව නිශ්චය වශයෙන් සඳහන් කරන ලිඛිත දැන්වීමක් එම නිවස අයිතිකරු වෙත බාර දෙනු ලැබීමට සභාපති විසින් සැලැස්විය යුතුය.

18. (1) 17 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වූ දැන්වීමක් භාර කරනු ලැබූ හැම නිවෙස් හිමියෙකු විසින් ම එම දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව එහි නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළතදී කටයුතු කළ යුතුය.

(2) 17 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වූ දැන්වීමක සඳහන් නියම යන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වූ විට හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කළ විට, සභාපති විසින් එම කටයුතු කරවා ඒ සඳහා දරන ලද වියදම් සභාවට අයවිය යුතු ණය මුදලක් වශයෙන් නිවෙස් හිමියාගෙන් අයකර ගත හැකිය.

19. (1) මහජනයා රැස්වන හෝ වැඳුම් පිදුම් කරන ඕනෑම ස්ථාන යක අයිතිකරු, පදිංචිකරු හෝ එය බාරව සිටින තැනැත්තා විසින් එම ස්ථානය ප්‍රමාණවත් පරිදි වාතාශ්‍රයෙන් යුක්තවත්, පවිත්‍රවත්, සනීපාරක්ෂක තත්ත්වයෙනුත් තබාගත යුතුය.

(2) මහජනයා රැස්වන හෝ වැඳුම් පිදුම් කරන ඕනෑම ස්ථානයක අයිතිකරු විසින්, පදිංචිකරු විසින් හෝ එය බාරව සිටින තැනැත්තා විසින්, එසේ කිරීම අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවකදී මහජනයා රැස්වන හෝ වැඳුම් පිදුම් කරන එම ස්ථානය පවිත්‍ර කරන ලෙස හෝ හුණු ගාන ලෙස එම ස්ථානයේ අයිතිකරු, පදිංචිකරු හෝ එය බාරව සිටින තැනැත්තා වෙත බාරදෙනු ලැබූ ලිඛිත දැන්වීමකින් දැන්වීමේ නිශ්චිතව සඳහන් කාල සීමාව තුළදී ඔහුට නියෝග කිරීමට සභාපතිට පුළුවන.

(3) 2 වැනි ඡේදය යටතේ වූ දැන්වීමක් භාරකරනු ලැබූ හැම තැනැත්තෙකු විසින් එම දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව, එහි නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත දී කටයුතු කළ යුතුය.

(4) 2 වැනි ඡේදය යටතේ වූ දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට කිසියම් තැනැත්තෙකු අපොහොසත් වූ විට හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කළ විට, සභාපති විසින් එම කටයුතු කරවා, ඒ සඳහා දරන ලද වියදම් සභාවට අයවිය යුතු ණය මුදලක් වශයෙන් එම තැනැත්තාගෙන් අයකර ගත හැකිය.

20. ඕනෑම ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ස්වකීය ඉඩම, රොඩුබොඩු හා කුණු කසළ වලින් තොරව තබා ගත යුතු වනවාත් හැර, එම රොඩු බොඩු හා කුණු කසළ මදුරුවන් බෝවීම හා කිසියම් හිරිහැරයක් සිදුවීම වැළැක්වීම පිණිස පුළුස්සා දැමීම, වළලා දැමීම හෝ වෙනත් යම් අන්දමකින් ඉවත් කිරීම හෝ කළ යුතුය.

### මායිම් සහ වැටවල්

21. වගා නොකරන ලද හැම ඉඩමකම අයිතිකරු, බදුකරු, පදිංචි කරු හෝ එය බාරව සිටින තැනැත්තා විසින් එවැනි ඉඩම්වල මායිම්, ඉණි වැටවල් වලින් හෝ කපන ලද අගල් වලින් හෝ ශක්තිමත් ලෙස පොළව යට ගිල්වන ලද ගල්වලින් හෝ ගම් ප්‍රදේශයේ පවත්නා සිරිත අනුව වූ වෙන යම් ක්‍රමයකින් හෝ සලකුණු කළ යුතුය.

22. වගා කරන ලද හැම ඉඩමකම අයිතිකරු, බදුකරු හෝ පදිංචි කරු හෝ එය බාරව සිටින තැනැත්තා විසින් එවැනි ඉඩමක මායිම වටා වැටක් ඉදිකොට එය මනා තත්වයෙන් පවත්වා ගත යුතුය.

23. එකට යාබද ඉඩම් දෙකක් සම්බන්ධයෙන් එවැනි ඉඩම්වල අයිතිකරුවන්, බදුකරුවන්, පදිංචිකරුවන් හෝ ඒවා බාරව සිටින තැනැත්තන් විසින් එම ඉඩම්වල පොදු මායිම සෑදෙන පරිදි යම් සලකුණක් කිරීම, අගලක් කැපීම හෝ වැටක් බැඳීම පිළිබඳවත්, එය මනා තත්වයෙන් පවත්වාගෙන යාම පිළිබඳවත් එක්ව වගකිව යුතුය. එසේ වුවද, එවැනි ඉඩම් දෙකකින් එක් ඉඩමක අයිතිකරු, බදුකරු, පදිංචිකරු හෝ එය බාරව සිටින තැනැත්තා විසින් අනික් ඉඩමේ පිහිටි ගස් හෝ පැලැටිවලට හෝ යම් හානියක් සිදුවීම වැළැක්වීම පිණිස වූ නිසි පිළිවෙත් සියල්ලක්ම යොදා ස්වකීය වියදමින් පොදු මායිමේ වැටක් ඉදි කිරීම නිත්‍යානුකූල විය යුතු ය.

24. ස්වකීය වියදමින් පොදු මායිමේ වැටක් ඉදි කරන යම් තැනැත්තෙකුට පැල ඉණිවල පලදාවන් භුක්ති විඳීමේ අයිතිය තිබිය යුතු අතර, ඔහුගේ කැමැත්ත නැතිව කිසිම තැනැත්තෙකු විසින් එවැනි පැල ඉණිවල කොළ කැඩීම හෝ අතු කැපීම හෝ නොකළ යුතුය.

25. කිසියම් ඉඩමක වැටක්, අගලක් හෝ මායිම් සලකුණක් තැනීමේ හෝ අළුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා එකී ඉඩමේ අයිති කරු, බදුකරු, පදිංචිකරු හෝ එය බාරව සිටින තැනැත්තා හෝ ඔහුගේ සේවකයින්, අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ද ඇතිව, ඕනෑම යාබද ඉඩමකට ඇතුළුවීම නීත්‍යානුකූල විය යුතු ය.

26. ඕනෑම ඉඩමක පිහිටි කිසිම වැටක් හෝ මායිමක් වෙනස් කිරීම හෝ මකා දැමීම හෝ ඊට හානි විය හැකි යම් ක්‍රියාවක් කිරීම හෝ කිසියම් බිම් සලකුණක් ඉවත් කිරීම කිසිම තැනැත්තෙකු විසින් ඕනෑකමින්ම නොකළ යුතුය.

### දඩාවතේ යන ගවයින්

27. ගම් ප්‍රදේශය ඇතුළත ඕනෑම පොදු පාරක් හෝ මාවතක් දිගේ දඩාවතේ යන ගවයින්, බැටලුවන් හා එළුවන් සියල්ලක්ම අල්ලා ගැනීමෙන් පසු, සභාව විසින් එම කාර්යය සඳහා පිහිටුවා ඇති ගාලෙහි නැබිය යුතුය.

28. එසේ ගාල් කරන ලද කිසියම් සතෙකු ඉවත්කර ගෙන යාමට පෙර ගෙවිය යුතු ගාස්තු පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බැලිය යුතුය.

| | රු. ශ. |
|---|---|
| එක් සතෙකු දිනක් හෝ දිනකින් කොටසක වේලා වක් තබා ගැනීම වෙනුවෙන් ... ... | 1.00 |
| එක් සතෙකුට ආහාර (සපයන ලද්දේ නම්) දිනකට හෝ දිනකින් කොටසක වේලාවක් වෙනුවෙන් ... | 75 |

### අපථ්‍යය ආහාර පාන

29. අපථ්‍ය වූ හෝ මනුෂ්‍ය ආහාරයට නුසුදුසු වූ කිසිම ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් වෙළඳාමට තැබීම හෝ ඉදිරිපත් කිරීම කිසිවකු විසින් නොකළ යුතුය.

30. වෙළඳාම පිණිස තබා තිබෙන හෝ ඉදිරිපත් කර තිබෙන ඕනෑම ආහාර ද්‍රව්‍යයක් හෝ බීමක් මනුෂ්‍ය ආහාරයට නුසුදුසු බව හෝ අපථ්‍ය බව පෙනේ නම්, සභාපති විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් හෝ සභාපති විසින් ලියවිල්ලකින් අවසර දෙන ලද වෙන යම් තැනැත්තෙකු විසින් එබඳු ආහාර ද්‍රව්‍ය හෝ බීම වර්ග තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

31. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හැර වෙනයම් නිලධාරියෙකු හෝ තැනැත්තෙකු විසින් කිසියම් ආහාර ද්‍රව්‍යයක් තහනමට ගන්නා විට, ඔහු විසින් ඒ ද්‍රව්‍යය තහනමට ගත්තේ යම් කෙනෙකු භාරයේ තිබියදී ද ඔහු ඉදිරිපිටදීම ඒ තහනම් කරනු ලැබූ ද්‍රව්‍යයේ සැම්පලයක් භාජනයක බහා එම සැම්පලය අප්‍රමාදවම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ වෙනයම් රජයේ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතුය.

32. කිසියම් ආහාර ද්‍රව්‍යයක් හෝ පාන වර්ගයක් හෝ තහනමට ගත් විට, එම ද්‍රව්‍යය තහනම් කරනු ලැබුයේ යම් තැනැත්තෙකු බාරයේ තිබියදීද ඒ අය විසින් ඒ ද්‍රව්‍යයේ සැම්පලයක් සීල් තබා තමාට වුවමනායයි ඉල්ලා සිටියහොත් ඒ ද්‍රව්‍යය තහනම් කරන තැනැත්තා විසින් ඒ තහනම් කළ ද්‍රව්‍යයේ සැම්පලයක් භාජනයක බහා ඒ ද්‍රව්‍යය අයිතිව සිටි තැනැත්තා ඉදිරියේදීම සීල් තබා ඒ අයට දිය යුතුය.

33. ආහාර ද්‍රව්‍යයක් හෝ බීම වර්ගයක් තහනමට ගෙන ඇති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ආහාර ද්‍රව්‍යයක් හෝ බීම වර්ගයක් යම් වෛද්‍ය නිලධාරියකු වෙත ඉදිරිපත් කර තිබේද ඒ වෛද්‍ය නිලධාරියා එකී ද්‍රව්‍යය අපථ්‍යයයි හෝ මනුෂ්‍යාහාරයට නුසුදුසුයයි සහතික කරයි නම්, එම ද්‍රව්‍යය විකිණීමට තැබීම හෝ මනුෂ්‍යාහාරයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීම වැළැක්වෙන පරිද්දෙන් එය විනාශ කරනු ලැබීමට හෝ ඒ පිළිබඳව සුදුස්සක් කරනු ලැබීමට සභාපති විසින් කටයුතු සැලැස්විය යුතුය. එම ආහාර ද්‍රව්‍යය හෝ බීම වර්ගය අපථ්‍ය නොවේයයි හෝ මනුෂ්‍යාහාරයට සුදුසුයයි වෛද්‍ය නිලධාරියා සහතික කරයි නම්, ඒ ආහාර ද්‍රව්‍යය හෝ බීම වර්ගය අයිතිකරුට ආපසු දිය යුතුය.

34. ස්වාභාවික හේතූන් නිසා හෝ කිසියම් රෝගයකින් හෝ දියේ ගිලීමෙන් මියගිය හෝ වනමෘගයකු විසින් මරනු ලැබූ හෝ සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබීමෙන් හෝ පිස්සු බල්ලකු විසින් සපා කනු ලැබ මිය ගිය සතෙකුගේ මස් විකිණීම හෝ වෙළඳාමට තැබීම කිසිවකු විසින් නොකළ යුතුය.

### ඉඩම් සහ දේපළ

35. කිසිවකු විසින් යම් අම්බලමක්, මඩමක් හෝ එළිමහන් භූමියක් හෝ මහජන විනෝද කටයුතු සඳහා ඇති ස්ථානයක් විනාශ කිරීම, ඊට අලාභහානි කිරීම හෝ එය ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ යෙන් අවහිර කිරීම හෝ නොකටයුතුය.

36. සභාව වෙත පැවරී තිබෙන හෝ එය පාලනය යටතේ පවත්නා කිසියම් මුඩු බිමක් හෝ පොදු භූමි භාගයක් විනාශ කිරීම, ඊට අලාභහානි කිරීම හෝ එය බලෙන් අල්ලා ගැනීම කිසිවකු විසින් නොකළ යුතුය.

37. යම්කිසි නිශ්චිත ග්‍රාමයක ප්‍රයෝජනය සඳහා සභාව විසින් පොදු තණබිම් කිසිවක් වෙන් කර තිබෙන විට, එම ග්‍රාමයේ පදිංචිකරුවෙකු නොවන කිසිම පුද්ගලයෙකු විසින් එම තණ බිම්වල ගවයින් දක්ලි කිරීම හෝ ගවයින්ට දඬාවතේ හැසිරීමට ඉඩදීම සභාපතිගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරය නැතිව නොකළ යුතුය.

38. පොදු තණ බිමක් වශයෙන් වෙන් කර ඇති යම්කිසි ඉඩමක ප්‍රසිද්ධ වැටකට අලාභහානි කිරීම හෝ දොරටුවක් අවහිර කිරීම හෝ එහි ඇති වතුර වලක් කැත කිරීම හෝ ඊට වස දැමීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

## නොමනා හැසිරීම

39. කිසිම තැනැත්තෙකු රාත්‍රි 9 යෙන් පසු එළියක් නැතිව සහ නීත්‍යනුකූල හේතුවක් නොමැතිව කිසියම් පොදු මාවතක හෝ පාරක නිකරුනේ කාලය ගත කිරීම හෝ සංචාරය කිරීම හෝ නොකළ යුතුය. නියම වශයෙන් ම දැල්වීමක් නොකරන ලද විදුලි පන්දමක් හෝ දල්විය හැකි වෙන උපකරණයක් හුදෙක් ළඟ තබා ගැනීම පමණක් මෙම අතුරු ව්‍යවස්ථාවෙහි කාර්යයන් සඳහා ප්‍රමාණවත් යයි නො සැලකිය යුතුය.

40. කිසිම තැනැත්තෙකු පොදු මාවතක හෝ පාරක හෝ මහා මාර්ගයක හෝ පොදු ස්ථානයක බීමත්ව හෝ තමන්ට හසුරුවා ගත නොහැකි තත්ත්වයකින් හෝ නොහික්මුණු අන්දමකින් හැසිරීම නොකළ යුතුය.

41. අසභ්‍ය රචනයක් පළ කිරීමෙන් හෝ අසභ්‍ය යමක් ඇඳීමෙන් හෝ අසභ්‍ය සිංදුවක් හෝ කවියක් ගායනා කිරීමෙන් තවත් අයෙකුට හිත් වේදනාවක් ඇතිවන පරිද්දෙන් කටයුතු කිරීම හෝ මහජන විනීතභාවයට කැලැල් සිදු විය හැකි වෙනයම් ක්‍රියාවක් කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

42. කිසිම තැනැත්තෙකු විසින් වෙනත් යම් කෙනෙකුගේ නිවසට හෝ මිදුලකට ගල් හෝ කුණුරොඩු විසි කිරීම නොකළ යුතුය.

43. කිසිම තැනැත්තෙකු විසින් සභාපතිගෙන් ලබාගත් අවසර පත්‍රයක් ඇතිව හා එම අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් වේලාවන් හා සීමාවන් ඇතුළත මිස, ගම් ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් පොදු පාරක හෝ මාවතක රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීමක් හෝ ජනකායක් අමතා දේශනා කිරීම හෝ කථා පැවැත්වීම නොකළ යුතුය.

## දූ කෙළිය

44. (1) කිසිවකු විසින් ගම් ප්‍රදේශය ඇතුළත දදුවලින් හෝ කඩදාසි කුට්ටමෙන් හෝ දූ කෙලීම හෝ මුදල් ඔට්ටු කිරීමෙන් යම් ක්‍රීඩාවක් කිරීම හෝ මොනම අන්දමේවත් ඔට්ටු ඇල්ලීමකට සම්බන්ධවීම නොකළ යුතුය.

(2) කිසිවකු විසින් තමා පදිංචිව සිටින හෝ තමාට අයිතිව තිබෙන හෝ තමා භාරයේ තිබෙන ගෙයක, භූමිභාගයක, ඔරුවක, පාරුවක හෝ රථවාහනයක දාදුවලින් හෝ කඩදාසි කුට්ටමෙන් දූ කෙලීමට හෝ මුදල් ඔට්ටු ඇල්ලීමෙන් කිසියම් ක්‍රීඩාවක යෙදීමට ඉඩ නොදිය යුතුය.

## පොදු දැන්වීම්

45. සභාවේ අණ පරිදි ප්‍රදර්ශනය කර තිබෙන කිසියම් දැන්වීමක් විරූපී කිරීම හෝ විනාශ කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

46. සභාවේ යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ පටන් ගන්නා ලද යම් කාර්මාන්තයක් කිරීමේ දී සභාපතිගේ අධිකාරී බලය යටතේ පිහිටුවන ලද යම් දැන්වීම් පුවරුවක්, වැටක්, කණුවක්, බාධක ලීයක් හෝ වෙන යමක් ඉවත් කිරීම හෝ කිසියම් දැන්වීමක සඳහන් කර තිබෙන නියමයන් ඕනෑකමින්ම උල්ලංඝනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

## වැසිකිළි තැනීම

47. (1) මනුෂ්‍ය වාසය සඳහා පාවිච්චි කරනු ලබන කිසියම් ස්ථානයක අයිතිකරු හෝ බදුකරු විසින් වැසිකිළියක් සාදා පවත්වාගෙන යා යුතු ප්‍රදේශයක් වශයෙන් සභාව විසින් යම් ප්‍රදේශයක් විස්තර කර ඇති කල්හි, සභාපති විසින් එකී අයිතිකරු හෝ බදුකරු වෙත ලියවිල්ලකින් භාරකරනු ලබන දැන්වීමකින් ඒ දැන්වීමේ සඳහන් කොට ඇති යම්කිසි වර්ගයක හා ප්‍රමාණයක වැසිකිළියක් සභාව විසින් තීරණය කොට ඇති ප්‍රකාරයට වූ නියමයන්ට එකඟව ද කාණු ආදිය සම්බන්ධ කොට ද ස්ථානයේ අසවල් තැන සෑදිය යුතුයැයි නියම කළ හැකිය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි ඡේදය යටතේ වූ දැන්වීමක් භාර කරනු ලැබූ හැම ගෙවල් හිමියකු හෝ ගෙයක පදිංචිකරුවකු විසින්ම හැම අතින්ම ඒ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූල වැසිකිළියක් තමාට ඒ දැන්වීම භාරදුන් දින සිට දින තිහක් ඇතුළතදී සෑදිය යුතුය.

48. ගෘහ්‍ය කාර්යයන් සඳහා ජලය සපයන ළිඳකින් අඩි පනහක අර්ධ විෂ්කම්භය ඇතුළත වැසිකිළි වලක් සෑදීම හෝ පවත්වා ගෙන යාම සභාපතිගෙන් ලබාගත් අවසරය ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

## ගොඩනැගිලි සෑදීම

49. (1) කිසිම තැනැත්තෙකු විසින්—

(අ) කිසියම් ගම් සභා කරත්ත පාරක මැද සිට අඩි 15 ක, හෝ

(ආ) යථා කාලයේදී ගම් සභා කරත්ත පාරක් වශයෙන් පරිවර්තනය කරනු ලැබීමට නියමිත මාවතක් වශයෙන් සභාව විසින් නිවේදනය කර ඇති කිසියම් ගම් සභා මාවතක මැද සිට අඩි 15 ක,

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් මාවතක් හැර වූ වෙනයම් ගම් සභා මාවතක මැද සිට අඩි 7 ක

දුර ප්‍රමාණයක් ඇතුළත කිසියම් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම් ප්‍රදේශය ඇතුළත නොසෑදිය යුතුය.

(2) කිසිම තැනැත්තකු විසින් කිසියම් කරත්ත පාරක හෝ (1) වැනි ඡේදයෙහි සඳහන් මාවතක් ඔස්සේ ඒ බව සභාපතිට දින තිහකට කලින් නොදන්වා කිසියම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් නොසෑදිය යුතුය.

## වචනාර්ථ නිරූපණය

50. මෙම අතුරු ව්‍යවස්ථාවල—

" සභාපති " යනුවෙන් ගම් සභාවේ සභාපති අදහස් වේ.

" සභාව " යනුවෙන් බටහිර චින්නවෙඩ්ඩිකුලම් ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ. තවද

" ගම් ප්‍රදේශය " යනුවෙන් වවුනියාව දිස්ත්‍රික්කයේ බටහිර චින්නවෙඩ්ඩිකුලම් ගම් ප්‍රදේශය අදහස් වේ.

## උපලේඛනය

### කිරිපට්ටි බලපත්‍ර සඳහා වූ ගාස්තු

මහජනයාට කිරි සැපයීම පිණිස කිරි පට්ටියක් පවත්වා ගෙන යාම පිණිස වූ බලපත්‍ර—

| | | රු. ශ. |
|---|---|---|
| (අ) හරකුන් ගණන 3 කට වැඩි නොවන විට | ... | 2 00 |
| (ආ) හරකුන් ගණන 3 කට වැඩි වන විට එහෙත් 10 දෙනෙකුට වැඩි නොවන විට ... | ... | 5 00 |
| (ඇ) හරකුන් ගණන 10 කට වැඩි වන විට | ... | 10 00 |

6–802—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 66/47—ඇල්. ජී. ඩී.—බී. සී. 208.

## පොල්ගහවෙල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) සහ 152 වැනි වගන්ති යටතේ පොල්ගහවෙල සුළු නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 මැයි මස 29 දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථාව

1965 දෙසැම්බර් මස 10 වැනි දින අංක 14,581 දරන ගැසට් පත්‍රයේ පළවූ 1965 නොවැම්බර් මස 26 වැනි දින දරන දැන්වීමේ සඳහන් (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ අය කරනු ලබන කසළ ශෝධන විශේෂ වරිපනම් බද්දෙන්, පොල්ගහවෙල සුළු නගර සභා පරිපාලන සීමා තුළ පිහිටා තිබෙන සෑම කුඹුරක්ම 1966 වර්ෂය සඳහා නිදහස් විය යුතුය.

6–806—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## හැඳල උප නගර සභාව

### ආදයම් සහ වියදම් ලේඛනය—වර්ෂ 1964

| ආදයම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම ... ... | 89,156 65 | |
| බී.—මහා මාර්ග ... ... | 2,172 51 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 175 34 | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 22,083 99 | |
| ඊ.—මහජන විනෝදය (අධිකාරය 170(6)) ... | 59 75 | |
| ඇෆ්.—සොහොන් බිම් (අධිකාරය 181) ... | 25 0 | |
| ජී.—සුනඛයින් ලියා පදිංචි කරවීම (අධිකාර 334 සහ 333) ... ... | 11 0 | |
| එච්.—කිරුම් හා මිණුම් (අධිකාරය 127) ... | — | |
| අයි.—ගින්නේ ආරක්ෂාව ... ... | — | |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල ... | — | |
| | | 1,13,684 24 |
| **වෙනත් ලැබීම්** | | |
| 1.—තැන්පත් ... ... | 14,702 73 | |
| 2.—අත්තිකාරම් ... ... | 7,810 82 | |
| 3.—විවිධ ණය ගැතියන්ගේ ගිණුම ... | 2,710 39 | |
| 4.—අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය) ... | 5 0 | |
| 5.—ආදයම් එකතුවේ ගණු දෙනු— | | |
| (ඒ) දේපල බදු ගිණුම ... ... | 38,228 63 | |
| (බී) බදු මුදල් ගිණුම ... ... | 21,333 99 | |
| (ඊ) වරෙන්තු ගාස්තු ... ... | 240 38 | |
| | | 85,031 94 |
| | | 1,98,716 18 |
| 31.12.63 දිනට සභාවේ මුදල් ඉතිරිය ... | | 1,10,284 89 |
| | | 309,001 07 |

| වියදම | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 31,693 41 | |
| බී.—මහා මාර්ග ... ... | 36,594 62 | |
| සී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් ... | 16,064 47 | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 13,666 0 | |
| ඊ.—5 ... ... | 50 0 | |
| ඇෆ්.3—ඉදිකිරීම් ... ... | 960 0 | |
| ජී.3—බල්ලන්ගේ කරපටි ... ... | 20 0 | |
| | | 99,048 50 |
| **වෙනත් ගෙවීම්** | | |
| 1.—තැන්පත් ... ... | 25,420 71 | |
| 2.—අත්තිකාරම් ... ... | 7,956 56 | |
| 9.—විවිධ ණය හිමියන්ගේ ගිණුම ... | 1,446 09 | |
| 10.—අධිකතා හා ඌණතා ගිණුම ... | 53 52 | |
| 11.—ආදයම් එකතුවේ ගණුදෙනු— | | |
| (ඒ) දේපල බද්ද ... ... | 53,362 54 | |
| (බී) මස් කඩ බදු ... ... | 21,333 99 | |
| (ඊ) වරෙන්තු ගාස්තු ... ... | 1,300 19 | |
| | | 1,10,873 60 |
| | | 2,09,922 10 |
| 31.12.64 දිනට සභාවේ මුදල් ඉතිරිය ... | | 99,078 97 |
| | | 3,09,001 07 |

හැඳල උප නගර සභාවේ සභාපති තැන්පත් ඩී. ඇස්. ගුණසේකර වනමම ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 හැඳල උප නගර සභාවේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ නිවැරදිවූත් සත්‍යවූත් වාර්තාවක් බව සහතික කරමි.

ඩී. ඇස්. ගුණසේකර,
සභාපති,
හැඳල උප නගර සභාව.

නිවැරදි බවට සහතික කරන ලදී.
ඇම්. ඩී. ලෝරන්ස්,
සාමාජික,
හැඳල උප නගර සභාව, අංක 4.

1965 අප්‍රේල් මස 23 වැනි දින මා ඉදිරිපිට හැඳලදී සහතික කරන ලදී.
බී. ඇෆ්. පෙරේරා,
සමාදන විනිශ්චයකාර.

6–824/1—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## හැඳල උප නගර සභාව

### 1964 දෙසැම්බර් මස 31 දනින් අවසන් වූ වර්ෂයේ වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාවයි

**බැරකම්**

| තැන්පත් : | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| 1. සාමාන්‍ය ... ... | | 5,537 50 | |
| 2. රජයේ ආධාර—මරදන පාර ... | | 630 70 | |
| බලගල පාර ... ... | | 887 0 | |
| හේකිත්ත පාරේ බෝක්කුව ... | | 3 20 | |
| නිවාස යෝජනා ක්‍රමය ... | | 40,000 0 | |
| සුළු වාරි මාර්ග ... | | 135 25 | |
| කසළ ශෝධනය ... | | 842 0 | |
| | | | 48,035 65 |
| 63.12.31 දිනට මුදල් අයිකය ... | | 1,09,704 93 | |
| 1964 දී ලැබීම් ... ... | | 5 0 | |
| | | 1,09,709 93 | |
| 1964 දී ගෙවීම් ... ... | | 53 52 | |
| | | 1,09,656 41 | |
| 1964 ආදයම ... ... | 1,13,684 24 | | |
| 1964 වියදම ... ... | 99,048 50 | 14,635 74 | 1,24,292 15 |
| විවිධ ණය හිමියෝ ... | | | 800 0 |
| | | | 1,73,127 80 |

**වත්කම්**

| | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... ... | 636 74 |
| තක්සේරු බදු ... ... ... | 70,538 92 |
| බදු මුදල් ... ... ... | 824 86 |
| වරෙන්තු ගාස්තුව ... ... | 2,048 31 |
| 64.12.31 දින මුදල් පොතේ ඉතිරිය ... | 99,078 97 |
| | 1,73,127 80 |

හැදල උප නගර සභාවේ සභාපති තැන්පත් ඩී. ඇස් ගුණසේකර වන මම ඉහත සඳහන් වාර්තාව මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 හැදල උප නගර සභාවේ බැරකම් හා වත්කම් පිළිබඳ නිවැරදිවූත් සත්‍යවූත් වාර්තාවක් බවට සහතික කරමි.

ඩී. ඇස්. ගුණසේකර,
සභාපති,
හැදල උප නගර සාභව.

නිවැරදි බවට සහතික කරන ලදි.
ඇම්. ඩී. ලෝරන්ස්,
සාමාජික,
කොට්ඨාශ අංකය. 4, හැදල උප නගර සභාව.

1965 ක්වූ අප්‍රේල් මස 23 වැනි දින මා ඉදිරිපිට හැදල දී සහතික කරන ලදී.

බී. ඇෆ්. පෙරේරා,
සමාදාන විනිශ්චයකාර තැන.

6-824/2—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

# අය වැය ලේඛන

## බලන්ගොඩ නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවන පරිපූරක ලේඛනය

| වැය ශීර්ෂ හෝ උප වැය ශීර්ෂ | මුදල රු. ශ. | යෝජනා අංක සහ දිනයන් |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම්:— | | |
| 2. අතිරේක දීමනා— | | |
| බී. ගමන් ගාස්තු ... ... ... | 250 0 | 1966.2. 21 වෙනි දින යෝජනා අංක 9 |
| එච්. කරත්ත තහඩු ගාස්තු ... ... | 62 0 | 1966.5. 7 වෙනි දින යෝජනා අංක 16 |
| අයි. ගණකාධිකාරි ගාස්තු ... ... | 600 0 | 1966.5. 7 වෙනි දින යෝජනා අංක 16 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව— | | |
| 7. වෙළඳපොලවල් සහ ගාල් | | |
| ඩී.—ඉදි කිරීම ... ... ... | 10,000 0 | 1966.1.27 වෙනි දින යෝජනා අංක 8 |
| එ.—වේතන හා අතිරේක දීමනා ... ... | 975 0 | 1966.5. 7 වෙනි දින යෝජනා අංක 21 |
| | 11,887 0 | |

සී. එස්. රත්වත්ත,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.

බලන්ගොඩ නගර සභාව,
1966 මැයි 31.

6-839—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

### 1966 වර්ෂයේ දෙවැනි අතිරේක අය-වැය ලේඛනය

ඞී. 2 (ඕ) ගොන් කරත්ත සහ ලොරි — රුපියල් 10,000.00
ඞී. 3 (ඕ) ගොන් කරත්ත සහ ලොරි — රුපියල් 10,000.00

1966 ක්වූ මැයි මස 28 වෙනි දින පැවැත්වූ සභා රැස්වීමේදී අංක 21 දරණ යෝජනා ස්ථිරත්වයෙන් ඉහත සඳහන් අතිරේක අය වැය ලේඛනය සභාව විසින් සම්මත කරගන්නා ලදී.

ජී. ඒ. ඞී. ඇල්. තිලකරත්න,
වේයන්ගොඩ සුළු නගර සභාවේ සභාපති.

වේයන්ගොඩ,
1966. 5. 29 වෙනි දින.

6-837—66.6.16 දින අංක 14,700 දරනා ගැසට් පත්‍රය

---

## මීනුවන්ගොඩ සුළු නගර සභාව

### 1966 දෙවන පරිපූරක අය-වැය ලේඛනය

| වැය ශීර්ෂය | ගණන රු. ශ. |
|---|---|
| ඩී.—මහජන සෞඛ්‍යය.— | |
| 7. වෙළෙඳපොලවල් හා ගාල් | |
| (ඩී) ඉදිකිරීම ... ... ... | 6,000 0 |

1966 මැයි මස 30 වන දින පැවැත්වුණු මීනුවන්ගොඩ සුළු නගර සභාවේ මාසික සභා රැස්වීමේ අංක 5 (ආ) දරණ යෝජනාවෙන් ඉහත සඳහන් පරිපූරක අය-වැය ලේඛනය සභාසම්මත විය.

ඩී. ඩී. විජේතුංග,
සභාපති,
මීනුවන්ගොඩ සුළු නගර සභාව.

1966 මැයි මස 3 වන දින,
මීනුවන්ගොඩ සුළු නගර සභා කාර්‍යාලයේදීය.

6—834—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

## දෙඩන්දූව සුළු නගර සභාව

**1966 දෙවැනි පරිපූරක අය වැය ලේඛනය**

1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | | ගණන රු. ශ. |
|---|---|---|
| ඒ. 1. | (ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... | 400 0 |
| ජී. 1. | බල්ලන් විනාශ කිරීම ... ... | 66 0 |
| | | 466 0 |

1966 මැයි 29 වැනි දින පවත්වන ලද දෙඩන්දූව උප නගර සභාවේ මාසික රැස්වීමේ යෝජනා අංක 5 සහ 9 (10) යටතේ සභා සම්මත විය.

බී. ජේ. ජයවර්ධන,
සභාපති,
උප නගර සභාව, දෙඩන්දූව.

1966 ජුනි 3.

6-558—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

මගේ අංකය: ඇස්. සී./සී2.

## මාතලේ මහ නගර සභාව

**පිස්සු බලු උවදුර පිළිබඳ දැන්වීමයි**

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ පිස්සු බලු රෝග ආඥා පණතේ 11 වැනි වගන්තිය ප්‍රකාර (476 වැනි පරිච්ඡේදය) මාතලේ මහ නගර සභාවේ පාලන සීමාව ඇතුලත පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක්, මිදුලක්, ගෙවත්තක් නොවන කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනත් කිසියම් ස්ථානයක සිටින නොබඳින ලද හෝ බැඳ නොගෙන යන ලද කිසියම් බල්ලෙකු මාවිසින් ලියවිල්ලකින් දෙන ලද බලය ඇති කිසියම් පුද්ගලයකු විසින් එවේලේම විනාශකර දමනු ලැබේ.

මෙම ප්‍රකාශය ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවන දින සිට හය මාසයක් ගතවන තුරු වලංගු වන්නේය.

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
නාගරික කොමසාරිස්.

නගර සභා කාර්යාලය,
මාතලේ,
28.5.1966.

6-819—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## දෙහිඕවිට සුළු නගර සභාව

**1966 වර්ෂයේ වරිපනම් ලේඛන**

1966 වර්ෂය සඳහා වූ, දෙහිඕවිට සුළු නගර සභාවේ වරිපනම් බදු ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාලයීය වේලාවන් තුළදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) නාගරික සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

කේ. ඩී. බී. කැනෝ්ගියස්,
සභාපති,
දෙහිඕවිට සුළු නගර සභාව.

1966 මැයි මස 30 වෙනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේදීය.

6-832—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## උඩුබද්දව ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත—201 වැනි පරිච්ඡේදය**

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් 1966 වර්ෂය සඳහා මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට උඩුබද්දව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වනුයේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පතේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත දැන්විය යුතු බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වන පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 වැනි ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| කේ. ඩී. පීටර් මහතා වී. සී. 15, හපුගොඩ, කඳාන. | හරක් මස් හා ඌරු මස් | ඩී. ඇම්. සමරතුංග මහතාට අයත් කුඹුක්ගහ මුල්ල වත්තෙන් බෙදු වෙන්කළ, නො. 254 ප්ලෑනයේ ලොට් නො. 21 දරණ බිම් කොටස |

ජේ. එච්. ටිකිරිබණ්ඩා,
උඩුබද්දව ගම්සභාවේ සභාපති.

1966 මැයි මස 31 වන දින,
උඩුබද්දව ගම්සභා කාර්යාලයේ දී ය.

6-830—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## වෙල්ගම පළාත ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අයවළුන් විසින් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දැක්වෙන ස්ථානයේ 1966 වර්ෂයේ ජූනි මස 1 වෙනි දින සිට 1966 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා මස් විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පත් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන වෙල්ගම පළාත ගම්සභා ප්‍රදේශ සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | ඒ. අයි. කබීර්, 42, කෙලින් වීදිය, ධර්ගා ටවුන්. | අකුර මාකට් එකේ නො. 1 මස්කඩ කාමරය | හරක් මස් |
| 2. | ඒ. අයි. කබීර්, 42, කෙලින් වීදිය, ධර්ගා ටවුන්. | නො. 2 මස්කඩ කාමරය | හරක් මස් |
| 3. | ඒ. අයි. කබීර් 42, කෙලින් වීදිය, ධර්ගා ටවුන්. | නො. 3 මස්කඩ කාමරය | එළු මස් |

ඩී. ඒ. කන්නන්ගර,
වෙල්ගම පළාත ගම්සභාවේ සභාපති.

1966 මැයි මස 30 වැනි දින,
වෙල්ගම පළාත ගම්සභා වේ දී ය.

6—829A—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

## මුල්ලේරියාව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් බලපත්‍ර සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ නියමිත බලපත්‍ර ගාස්තු මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට (256 වැනි අධිකාරය) සුළු නගර සභා ආඥාපනතේ 161 වෙනි හා 163 වෙනි වගන්ති යටතේ මුල්ලේරියාව සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ඩී. කරුණාරත්න,
සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
මුල්ලේරියාව, 1966 ජූනි 7 දින.

### උපලේඛනය

පහත සඳහන් කරුණු සඳහා යම් භූමිභාගයක් හෝ ස්ථානයක් තබා ගැනීම සඳහා වූ බලපත්‍රයකට :—

| වාර්ෂික ගාස්තුව | රු. | ශ. |
|---|---|---|
| ආගුම්හල (රෙස්ටුරන්ට්) පවත්වා ගෙන යාම ... | 25 | 00 |
| භෝජනාගාරයක් පවත්වා ගෙන යාම ... | 15 | 00 |
| බේකරියක් පවත්වා ගෙන යාම ... | 15 | 00 |
| තේ හෝ කෝපි කඩයක් පවත්වා ගෙන යාම ... | 5 | 00 |
| බත් කඩයක් පවත්වා ගෙන යාම ... | 15 | 00 |
| බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම ... | 10 | 00 |
| පොල් තෙල් ගබඩා කිරීම (ගැලුම් 100 ට වැඩි) ... | 25 | 00 |
| ගෝනි ගබඩා කිරීම ... | 10 | 00 |
| විදුලි කර්මාන්ත වැඩ පළක් පවත්වාගෙන යාම ... | 5 | 00 |
| ස්වර්ණාභරණ සාදන ස්ථානයක් පවත්වාගෙන යාම ... | 10 | 00 |
| මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම ... | 50 | 00 |
| ආචාරි පට්ටලයක් හෝ කම්හලක් පවත්වාගෙන යාම | 5 | 00 |
| කළු ගල් මෝලක් පවත්වාගෙන යාම ... | 50 | 00 |
| භූමිතෙල් ගබඩා කිරීම (ගැලුම් 100 ට වැඩි) ... | 5 | 00 |
| කළු තෙල් හෝ පැට්රල් ගබඩා කිරීම ... | 25 | 00 |
| මෝටර් රථ අළුත් වැඩියා කිරීම සඳහා වැඩ පොළක් පවත්වාගෙන යාම ... ... | 10 | 00 |
| හුණු හෝ සිමෙන්ති ගබඩා කිරීම ... | 10 | 00 |
| කබොක්, බොරළු හෝ කළු ගල් ලබා ගැනීම සඳහා වලවල් කැපීම ... ... | 15 | 00 |
| පිදුරු ගබඩා කිරීම ... ... | 5 | 00 |
| අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 25 | 00 |
| මිරිස් හෝ කුළු බඩු ඇඹරීමේ මෝලක් පවත්වාගෙන යාම ... ... ... | 15 | 00 |
| කෙඳි වර්ග නිෂ්පාදනය කිරීම ... ... | 25 | 00 |
| අම්ලකර වායුව (ඔක්සිජන්) පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම ... ... | 5 | 00 |
| සීසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 25 | 00 |
| උස්සන යන්ත්‍රයක් ඇතිව කාර් ශුද්ධ කරන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 25 | 00 |
| පා පැදි අළුත් වැඩියා කරන හෝ ශුද්ධ කරන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 2 | 50 |
| ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 10 | 00 |
| අඟුරු සඳහා දර හෝ පොල් කටු පිළිස්සීම ... | 10 | 00 |
| බෙලෙක් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 25 | 00 |
| බෙලෙක් වැඩ පළක් පවත්වාගෙන යාම ... | 5 | 00 |
| ටයර් ටියුබ් වෝල්කනයිසිං කරන වැඩ පළක් පවත්වාගෙන යාම ... ... | 5 | 00 |
| රබර් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම ... | 100 | 00 |
| විදුලියෙන් රංජනය කිරීම සඳහා වැඩ පළක් පවත්වාගෙන යාම ... ... | 25 | 00 |
| තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 100 | 00 |
| ටී කොටන මෝලක් හෝ යන්ත්‍රයක් පවත්වාගෙන යාම ... ... | 15 | 00 |
| වධු මඩුවක් පවත්වාගෙන යාම ... | 5 | 00 |
| ලී බඩු සාදන ස්ථානයක් පවත්වාගෙන යාම ... | 25 | 00 |
| තෙල් ඉන්දන, වාෂ්ප හෝ විදුලි බලය මගින් ක්‍රියා කරවන යන්ත්‍ර පාවිච්චි කරන යම් ව්‍යාපාරයක් | 200 | 00 |
| කපු පුළුන් ගබඩා කිරීම ... ... | 25 | 00 |
| ලී ගබඩා කිරීම ... ... | 25 | 00 |
| දර ගබඩා කිරීම ... ... | 10 | 00 |
| ජාඩි හෝ කරවල ගබඩා කිරීම (හො. 5 ට අඩු) ... | 5 | 00 |
| (හො. 5 ට වැඩි) ... | 10 | 00 |
| නරක් වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම ... | 5 | 00 |
| විනාකිරි සෑදීම ... ... | 25 | 00 |
| සබන් සෑදීම ... ... | 50 | 00 |
| සතුන්ගේ හම් හෝ ඇට ගබඩා කිරීම ... | 50 | 00 |
| කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි 3 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 100 | 00 |
| සෝඩා සෑදීම ... ... | 50 | 00 |
| සුරුට්ටු හෝ සිගරැට් සෑදීම ... ... | 25 | 00 |
| බීඩි එතීමේ කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම ... | 10 | 00 |
| දුම්කොළ පදම් කර හෝ වියලා සකස් කිරීම ... | 100 | 00 |
| ආහාර ද්‍රව්‍ය හා කෑම් බීම ආදිය සිල්ලරට විකිණීම සඳහා වෙළඳ සැලක් පවත්වාගෙන යාම ... | 7 | 00 |
| තොග ගණනේ විකිණීම සඳහා නරක් වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම ... ... | 50 | 00 |
| රබර් දුම් ගැසීම ... ... | 5 | 00 |
| සිට් රබර් හෝ ක්‍රේප් රබර් සෑදීම සඳහා රෝලක් තබා ගැනීම ... ... | 10 | 00 |
| ගිස් බෝතල ගබඩා කිරීම ... ... | 10 | 00 |
| යම් ධාන්‍ය හෝ ඇට වර්ග (ගෝනි 10 කට වැඩි ප්‍රමාණයක්) ගබඩා කිරීම ... | 5 | 00 |
| පුන්නක්කු හෝ සතුන් හෝ කුරුල්ලන් සඳහා වූ ආහාර ද්‍රව්‍ය (හො. 3 කට වැඩි ප්‍රමාණයක්) ගබඩා කිරීම ... ... | 5 | 00 |
| ගඩොල් හෝ උළු සෑදීම හෝ පිච්චීම— | | |
| කැට 2 ට ... ... | 15 | 00 |
| කැට 2 ට වැඩි ... ... | 25 | 00 |
| බැටරි පිරවීම ... ... | 50 | 00 |

6–827—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## වැලිගම නගර සභාව

### ජලභීතිකා රෝගය

වැලිගම නගර සභා සීමාවතුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාවතුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන, දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවේලෙහිම විනාශ කරණු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥාපනතේ 11 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය 1966 ජූනි මස 6 වෙනි දින සිට හය මාසයක් වලංගු වන්නේ ය.

ම. ප. ලීලාරත්න,
වැලිගම නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
වැලිගම,
6. 6. 1966.

6–836—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පණතින් සංශෝධිත 257 වැනි අධිකාරය වන, ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ වෙල්ගම පළාත ගම්සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ 3 උප වගන්තියෙන් නමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති වරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

### අතුරු ව්‍යවස්ථා

ගම්බද වෙළඳ පොලවල් හා පොලවල්,

වෙල්ගම පළාත ගම්සභාව විසින් පිහිටුවන ලද අතුරු වෙළඳ පොලේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භයක් ඇති කවයක්, ඇතුලතවූ ප්‍රදේශය ඒ වෙළඳාම් පොලේ වෙළඳ ප්‍රදේශය වශයෙන් මෙසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

තවද, එකී ප්‍රදේශය ඇතුලත මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට වෙල්ගම පළාත ගම්සභාවේ සභාපති තැනගේ බලපත්‍රයක් නොමැතිව මස් හෝ මාළු විකිණීම මෙයින් තහනම් කර සිටිනු ලැබේ.

ඩී. ඒ. කන්නන්ගර,
වෙල්ගම පළාත ගම්සභාවේ සභාපති.

1966 මැයි මස 30 වෙනි දින,
ගම්සභා කාර්යාලයේ දීය.

6–829—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණතේ 3 වන වගන්තිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණලද බව, 1965 ජනවාරි මස 5 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වෙනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

ඒ. එච්. ජයසේන,
සභාපතිතැන.

බුත්තල ගම්සභා කාර්යාලයේ දීය,
1966.6.6.

6–826—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 සහ 163 වැනි වගන්ති යටතේ, වෙන්නප්පුව සුළු නගර සභාව විසින් මේ නිවේදනයට යාකොට ඇති උපලේඛනයෙහි විස්තර කෙරෙන බලපත්‍ර සම්බන්ධයෙන් එහි නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පලකරනු ලබන දින සිට පනවා ඇති බව මෙසින් දැනුම් දෙනු ලැබේ.

සිඩ්නි ප්‍රනාන්දු,
වෙන්නප්පුව සුළු නගර සභාවේ
සභාපති.

1966 ක්වූ අප්‍රේල් මස 22 වැනි දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

පහත දැක්වෙන කාර්යයන් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමට බලය ලබාදේන බලපත්‍රයක් :—

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තු | |
| --- | --- | --- |
| | රු. | ශ. |
| තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යෑම | 10 | 0 |

6–825—66.6.16 දින අංක 14,700 දරණ ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නාගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ 'අකුරු ලිවිය යුතුයි.

8. 'වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. 1966 මාර්තු මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 15 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 15 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 165 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 330 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 66.7.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| එක් කොටසක් ... ... ... | 36 0 | 49 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 26 0 | 31 50 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 33 50 | 41 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වනු සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 40 | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 80 | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 20 | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 40 | 0 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය.

## උපලේඛනය

### 1966

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 66. 3. 4 | සිකුරාද ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සිකුරාද ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද ... | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් ... | 66. 4. 1 | සිකුරාද ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්ද ... | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි ... | 66. 5. 6 | සිකුරාද ... | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි ... | 66. 6. 3 | සිකුරාද ... | 66. 5.25 | බදාද | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්ද ... | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්ද ... | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද ... | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි ... | 66. 7. 1 | සිකුරාද ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද ... | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කම්හල් සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී